# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 82 — 1973 ඔක්තෝබර් 19 වැනි සිකුරාදා — 1973.10.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (IIආ) වැනි ඡේදය—පලකිරීම්


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1439 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| නිරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 1455 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1456 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | 1459 | විවිධ දැන්වීම් ... ... ... | — |


සැ. යු.—ධීවර (සංශෝධන) පනත් කෙටුම්පත 1973 ඔක්තෝබර් 12 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 2.) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| (1) පත්ච් කාඩ් උපකරණ ආදිය විකිණීම ... | 1973. 11. 20 |
| (2) අතිරික්ත හා ප්‍රයෝජනයට ගත නොහැකි බෝල්ට් ඇණ, මුරිච්චි, මෘදු වානේ කෝණ සහ යකඩ භාණ්ඩ ආදිය මිලට ගැනීම හා ඉවත් කිරීම ... | 1973. 11. 20 |

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

විෂය අංක 1 සඳහා රු. 50ක් ද අංක 2 සඳහා රු. 200ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙයි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින පෙරවරු 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඇස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973. 10. 19 වැනි දින,
කොළඹ දීය.

10–640—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) සහ (IIආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පලවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, යුනියන් පෙදෙසේ විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 560, කොළඹ.) සිමෙන්ති කොන්ක්‍රීට් පයිප්ප ආදිය සැපයීම සඳහා 1973 නොවැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩදෙනු ලැබේ.

කොළඹ, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1973 නොවැම්බර් මස 21 වැනි බදාදා පෙ. ව. 11 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොල දෙනු ලැබේ.

සිමෙන්ති කොන්ක්‍රීට් පයිප්ප සම්බන්ධයෙන් ඒ ඒ ටෙන්ඩර් කරුවන් විසින් කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ 363 දරණ විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන් තමන්ගේ සැම්පල් පරීක්ෂාකරවා ගෙන ඒ සඳහා ලැබෙන සහතික පත් ස්වකීය ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුය.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ලංකා ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදිත භාණ්ඩවලට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

ඇස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973. 10. 19 වැනි දින,
කොළඹ දීය.

10–639—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### සිලිකන් කාබයිඩ්, ෆෙරෝ සිලිකන්, ෆෙරෝ ෆොස් ෆරස් සෝඩියම් කාබනේට්, කැල්සියම් කාබයිඩ්, රැමින් මිශ්‍රණ, කැල්සියම් සිලිකන්, ලින්සීඩ් තෙල්, සෝඩියම් සිලිකේට්, කැල්සියම් කාබයිඩ්, සහ කෝල් ටාර් සැපයීම

1973 නොවැම්බර් මස 22 වැනි දින පෙරවරු 10 දක්වා ඉහත සඳහන් සපයීම සඳහා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. රු. 100ක ආපසු ලබා ගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා අවශ්‍ය ටෙන්ඩර් ෆෝර්ම මෙම කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩරය අවසන් වන දිනට පළමු වැඩ කරන දින දහවල් 12න් පසු භාර ගනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර් ෆෝර්ම රු. 10ක් ගෙවීමෙන් ලබා ගත හැක.

මිලට ගැණුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670, 242, හැව්ලොක් පාර,
කොළඹ 5.

10–573—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

නාත්තන්ඩිය කැද දැමීමේ ආයතනයේ ගොඩනගිල්ල අළුත් වැඩියා කිරීම සඳහා, කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973. 11. 09 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 25,000කට හෝ එයට වැඩි මුදලකට ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියා පදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගි වීමට කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට 1973. 11. 08 දින දහවල් 12ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1—(1/69).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973. 10. 06.

10–558—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

මාතලේ බලවේග ආයතනය අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973. 11. 09 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 25,000කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකිය

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට 1973. 11. 08 දින මධ්‍යාහ්න 12ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1—(1/70).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973. 10. 06

10–557—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කුරුණෑගල කැද දැමීමේ ආයතනයේ විවේකාගාර ගොඩනැගිල්ලට අමතර කාමරයක් ඉදිකිරීම සඳහා, කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973. 11. 09 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 18,000කට හෝ එයට වැඩි මුදලකට ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියා පදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගි වීමට කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට 1973. 11. 08 දින දහවල් 12ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතුවේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1—(1/68).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල, කොළඹ 1.
1973. 10. 06.

10–560—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු, අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟවිය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චෙක්රෝල් පොත්, පෙරෙව්වූ පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. පෞද්ගලිකව ටෙන්ඩර්කරු වෙත භාරදෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් යවන ලද හෝ ටෙන්ඩරයට අදාළ සෑම දැන්වීමක්ම ටෙන්ඩර්කරු අතට පත් කළාසේ සළකනු ලැබේ.

15. 1934 වර්ෂයේ අංක 19 දරණ කම්කරු ආඥාපනතේ (117 වන අධිකාරිය) යටතේ සේවයෙහි යොදවන ලද කම්කරුවකු විසින් හෝ කම්කරුවෙකු වෙනුවෙන් ඉල්වනු ලබන වන්දියකින් කොන්ත්‍රාත්කරු රජය නිදහස් කළ යුතුය.

16. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයෙකු සේවයේ යෙදවීම අහිතකර දෙයක් ලෙස සලකා ඊට විරෝධය දැක්වීමේත්, යම් සේවකයෙකු සේවයේ යෙදවීමට කලින් විරුද්ධවීමේත් බලය රජය සතු වන්නේය.

17. වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජය මඟින් තබා ඇති ලේඛණයේ තනිතනිව හෝ ලේඛනයේ නම් සඳහන් වෙනත් අයකුගේ නම සමග හෝ ඇතුළු වී සිටින යම් පුද්ගලයෙකු සමග හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයාට හැඟී යන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව භාරදීම නුසුදුස්සෙකු ලෙස සළකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. මේ පිළිබඳ වැඩි විස්තර කටුගස්තොට බීජ මධ්‍යස්ථානයේ කළමනාකාර තැන ගෙන් දැනගත හැකිය.

ජේ. යූ. නානායක්කාර,
නියෝජ්‍ය අධ්‍යක්ෂ, (කෘෂිකර්ම ගොවිපල්).

1973 ක්වූ ඔක්තෝබර් මස 04 වන දින,
පේරාදෙණියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

10–553—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කොළඹ නාරාහේන්පිට, නාවල පාරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩපල හා යන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු තැන විසින් පහත සඳහන් ටයර් හා ටියුබ් කොළඹ 5, නාරාහේන්පිට වැඩපළ හා යන්ත්‍රාගාරයට ගෙනවිත් භාරදීම සඳහා 1973 නොවැම්බර් මස 11 වැනි දින සවස 2.00 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

අළුත් ටයර් හා ටියුබ් සැපයීම

| | | |
|---|---|---|
| 1. | ජීප් ටයර් 600 × 16 තීරු 4 ... ... | 100 යි. |
| 2. | වෑන් ටයර් 670/725 × 13 තීරු 6 ... ... | 50 යි. |
| 3. | ටියුබ් 600 × 16 ... ... ... | 100 යි. |
| 4. | ටියුබ් 400 × 19 ... ... ... | 100 යි. |
| 5. | ටියුබ් 750 × 16 (කර දිගට ඇති) ... | 50 යි. |
| 6. | ටියුබ් 750 × 16 (කර කෙටියට ඇති) ... | 50 යි. |
| 7. | ටියුබ් 520 × 10 ... ... | 20 යි. |
| 8. | ටියුබ් 670/725 × 13 ... ... | 30 යි. |

2. ටෙන්ඩර් පත් මුද්‍රා තැබූ කවරවල එවිය යුතු අතර කවරයේ උඩ වම් කෙළවර "ටයර් සහ ටියුබ් සැපයීම" යන්න සඳහන් කර නියමිත වේලාවට පෙර කොළඹ 5, නාරාහේන්පිට නාවල පාරේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, වැඩපළ හා යන්ත්‍රාගාරයේ කෘෂිකර්ම ඉංජිනේරු (සැපයීම්) වෙත එවිය යුතුය.

3. ප්‍රශ්න කිරීමකින් තොරව ටෙන්ඩර් පත් පිළි ගැනීමේ හෝ පිළි නොගැනීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත ඇත.

4. ටෙන්ඩර් දෙපිටපතකින් එවිය යුතුය.

ඇස්. පාස්කරන්,
කෘෂිකර්ම ඉංජිනේරු (සැපයීම්).

වැඩපළ හා යන්ත්‍රාගාරය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1728,
කොළඹ 5,
1973. 10. 08 දින.

10–547—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

ප්‍රවාහණ සේවය සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවීම

මෙහි පහත සඳහන් ප්‍රවාහණ සේවාවන් සඳහා, 1973 නොවැම්බර් මස 9 වැනි දින සිකුරාදා පෙරවරු 10.30 වන තෙක් රජයේ ලියාපදිංචි වූ ප්‍රවාහණ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර විවිධ සේවා සමිතිවලින් මිළ ගණන් කැඳවනු ලැබේ.

(1) 1974 ජනවාරි මස 1 වැනි දින සිට 1974 දෙසැම්බර් 31 වැනි දිනට අවසන් වන මුදල් වර්ෂය ඇතුලත, දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් අනුව, කොළඹ 2, මැලේ වීදියේ පිහිටි විභාග දෙපාර්තමේන්තුවේ සිට කොළඹ මහ නගර සීමාව ඇතුලත පිහිටි කුමන ස්ථානයකට හෝ ලිපි ද්‍රව්‍යයන් අඩංගු පාර්සල්, ගෝනිමලු ප්‍රවාහණ කිරීම.

ප්‍රවාහණය කිරීම සඳහා සපයනු ලබන ලොරිය හෝ ලොරි පෙරවරු 8.00 විභාග දෙපාර්තමේන්තු භූමිය වෙත එවිය යුතු අතර එකී රථය හෝ රථ මුදා හැරීම කළ හැක්කේ පස්වරු 3.30 න් පසුවය. ඉතා විශේෂ අවස්ථාවලදී සේවය සඳහා ලබා ගැනීමට අදහස් කරන ලොරිය හෝ ලොරි කාර්‍යාලයීය වේලාවෙන් පසුවද රඳවා ගැනීමට සිදු විය හැකිය. එක් ගමනක් සඳහා වාහනය යොදවන අවස්ථාවලදී සේවය අවසන් වූ විගස වාහනය නිදහස් කළ හැකිය.

(ii) කොළඹ මහ නගර සීමාවෙන් පිට ලිපි ද්‍රව්‍යයන් හෝ වෙනත් බඩු බාහිරාදිය ප්‍රවාහනය කිරීම.

(iii) ප්‍රවාහනය කිරීමට ඇති ලිපි ද්‍රව්‍යයන් අතර මරදානේ දුම්රිය බඩු ගබඩාවේ බඩු පෙට්ටිවල ඇති කඩදාසි රීල් ලොරිවලට පැටවීම සහ දෙපාර්තමේන්තුවේ ගබඩාව වෙත බෑම කොන්ත්‍රාත්කරු විසින් ඔහුගේම සේවකයින් යෙදවිය යුතුය. සාමාන්‍යයෙන් ලොකු රීල් එකකබර රාත්තල් 1,000 වන අතර පොඩි රීල් එකක බර රාත්තල් 500 ක් පමණ වේ.

(2) ඉහතකී 1 සහ ii යටතේ ඇති ප්‍රවාහණ සේවය සඳහා ලොරි රථයකට එක් ගමනකට අය කරන ගාස්තුව ද, මුලු දිනකට අය කරන ගාස්තුවද ඉහත කී (iii) යටතේ ඇති කඩදාසි රීල් එකක් පැටවීමට සහ බෑමට අයකරනු ලබන ගාස්තුවද වෙන් වෙන් වශයෙන් සඳහන් කළ යුතුය.

(3) සපයනු ලබන වාහනවලින් ප්‍රවාහණය කරනු ලබන පාර්සල්, ලිපි ද්‍රව්‍යයන් අඩංගු ගෝනිමලු යනාදි සෑම බඩුබාහිරාදියක්ම වැස්සට නොතෙමෙන සේ එම වාහනය උඩින් ආවරණය කළ යුතුය.

(4) පැටවීම සහ බෑමේ දී කඩදාසි රීල්වලට අලාභ හානි සිදු නොවීමට කොන්ත්‍රාත්කරු වගබලාගත යුතු අතර, ප්‍රවාහණය කිරීමේ දී සුරක්ෂිත භාවය රැක ගත යුතුය.

(5) මිල ගණන් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබා ඇත්තේ කොන්ත්‍රාත්කරු නමින් හෝ සමිතිය නමින් හෝ ලොරි රථ දෙකක් ලියාපදිංචි වී ඇත්නම් පමණි.

(6) ඉතා කෙටි කාලීන දැන්වීමකින් පසු කොන්ත්‍රාත්කරු අවශ්‍ය වන ප්‍රවාහණ සේවාවන් සැපයීමට සූදානමෙන් සිටිය යුතුය.

(7) මිල ගණන් බහාලනු ලබන කවරයේ වම් පස උඩ කෙලවරේ "ප්‍රවාහණ සේවා මිල ගණන්" යැයි සඳහන් කර සීල් තබා ලියාපදිංචි කළ තැපැලෙන් කොළඹ 2, මැලේ වීදිය, විභාග දෙපාර්තමේන්තුව, විභාග කොමසාරිස් යන ලිපිනයට එවිය යුතුය.

(8) 1973 නොවැම්බර් මස 09 වැනි දින පෙරවරු 10.30 ට මිල ගණන් සඳහන් කර සීල් තබා එවන ලද ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. මිල ගණන් ඉදිරිපත් කළ අය හෝ ඔහුගේ නියෝජිතයෙකුට (අවසර බලපත්‍රයක් සමග) හෝ මේ අවස්ථාවේ දී පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

1973 10. 02 දින,
විභාග දෙපාර්තමේන්තුව,
කොළඹ 2.

10–644—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

**කොළඹ (කටුනායක) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ තීරු බද්දෙන් නිදහස් වෙළඳසැල් පවත්වාගෙන යෑමේ වරප්‍රසාදය**

කොළඹ (කටුනායක) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි තීරු බද්දෙන් නිදහස් පහත සඳහන් වෙළඳ සැල් පවත්වාගෙන යෑමේ වරප්‍රසාදය පිරිනැමීම සඳහා 1973 නොවැම්බර් 23 වැනි දින පෙ. ව. 10 තෙක් "කොළඹ 1, තැ. පෙ. 535." යන ලිපිනයෙන් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ:—

වෙළඳ සැල අංක : 1—තීරු බද්දෙන් නිදහස් මත්පැන් සහ දුම්කොළ විකිණීම. (මාසික අවම බදුකුලිය රු. 10,000 කි.)

වෙළඳ සැල අංක : 2—තීරු බද්දෙන් නිදහස් ස්වර්ණාභරණ හා ඔර්ලෝසු විකිණීම. (මාසික අවම බදුකුලිය රු. 8,500 කි.)

වෙළඳ සැල අංක : 3—තීරු බද්දෙන් නිදහස් කැමරා, සුවඳ විලවුන් ආදිය විකිණීම. (මාසික අවම බදු කුලිය රු. 4,500 කි.)

වෙළඳ සැල අංක : 4—පොත්, සඟරා හා පුවත්පත් ආදිය විකිණීම. (මාසික අවම බදුකුලිය රු. 1,000 කි.)

ඉහත සඳහන් එක් එක් වෙළඳ සැලට ඉදිරියෙන් දක්වා ඇති මාසික අවම බදුකුලිය හෝ විදේශ විනිමය එකතුවීම් මත "විවිහිස" ලැබීම් ඇතුළුව සම්පූර්ණ මාසික ලැබීම් වලින් සියයට 10 ක් හෝ යන දෙකින් වැඩි ප්‍රමාණය ටෙන්ඩර් කරුවන් විසින් ගෙවිය යුතු ය.

යථෝක්ත වරප්‍රසාදය පිරිනමනු ලබනුයේ 1974. 01. 01 සිට 74. 12. 31 දක්වා එක් අවුරුදු කාලසීමාවක් සඳහාය.

ටෙන්ඩර්කරුවන් අදාළ වෙළඳාමෙහි යෙදී යටත් පිරිසෙයින් පස් වසරක පළපුරුද්දක් ලබා තිබීම සහ/හෝ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ගුවන් තොටුපල තත්ත්වයන්ට අනුකූලව මෙම වෙළඳ සැල් පවත්වාගෙන යෑමට තමන් සතු සම්පත් හා හැකියාව පිළිබඳ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැන සෑහීමට පත්කළ හැකි තත්ත්වයක සිටීම අවශ්‍ය ය. විදේශීය ව්‍යවහාර මුදලින් ගණුදෙනු කිරීම සඳහා විනිමය පාලක තැනගේ අනුමැතිය මීට ඇතුළත් වේ.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් බැහැර ඕනෑම දිසාපති කාර්යාලයක හෝ රු. 250 ක මුදලක් තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1973 නොවැම්බර් 16 වැනි දින දහවල් 12 තෙක් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල දෙපිටපතින් ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය.

වැඩිදුර විස්තර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැක.

සී. ඩබ්ලිව්. ඇම්. අපොන්සො,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

1973. 10. 08 දා,
තැ. පෙ. 535,
ලෝටස් පාර,
කොළඹ 1,
සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ දීය.

10–642—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

## යුද හමුදා මූලස්ථානය

**සන්නද්ධ සේවාවන්හි වාහනවල ටයර් නැවත පිරවීම සඳහා ටෙන්ඩර් කැඳවීම—1974**

1. ඉහත සඳහන් සේවාව සඳහා ටෙන්ඩර් පත්, කොළඹ 2, බාලදක්ෂ මාවතේ, යුද හමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් 1973 ඔක්තෝබර් මස 30 වෙනි දින පූ. භා. 09.00 තෙක් භාර ගනු ලැබේ.

2. පනාගොඩ, යුද හමුදා විජිතයේ, යුද්ධෝපකරණ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් මෙම ටෙන්ඩර්පත් 1973 ඔක්තෝබර් මස 29 වෙනි දින පූර්වභාග 12.00 වන තෙක් නිකුත් කරනු ඇත. කොළඹ, බාලදක්ෂ මාවතේ, යුද හමුදා මූලස්ථානයේ, ගණකාධිකාරි කාර්යාලය වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන්, මෙම ටෙන්ඩර් පත් ලබාගත හැක.

3. මෙම ටෙන්ඩර් පිළිබඳ වැඩි විස්තර කාර්යාල වේලාවන්හිදී, පනාගොඩ යුද හමුදා විජිතයේ යුද්ධෝපකරණ අධ්‍යක්ෂක මණ්ඩලයෙන් ලබාගත හැක.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුදාධිපති වෙනුවට.

යුද්ධෝපකරණ අධ්‍යක්ෂක මණ්ඩලය,
හමුදා විජිතය,
පනාගොඩ, හෝමාගම,
1973 ඔක්තෝබර් මස 2 දින.

10–546—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව—මාර්ගමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශය

බණ්ඩාරවෙල ජලසම්පාදන යෝජනා ක්‍රමය සඳහා දළ වශයෙන් අඩි 50 ක් උස, අඩි 196 ක් දිග, මුදුනේ අඩි 4 ක සක්මන් වේදිකාවක් ඇති තුලුමං වේල්ලක් ඇතුලු ජල නිශ්චල කරණය සඳහා ඕවරකයක්, ළිඳක් හා පොම්පාගාරයක් තැනීම සඳහා ජල සම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන ඉංජිනේරු නිලධාරියා (නිර්මාණ) විසින් 1973 ඔක්තෝබර් මස 31 වන දින පූ. භා. 10 තෙක් ටෙන්ඩර් ලියවිලි නිකුත් කරනු ලැබේ.

3. රු. 275 ක ටෙන්ඩර් ගාස්තු (ආපසු ගෙවන තැන්පත් මුදල රු. 250 ක් වන අතර ආපසු නොගෙවනු ලබන මුදල රු. 25 ක් වේ). තැන්පත් කළ බවට රිසිට් පතක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ලියවිලි නිකුත් කරනු ලැබේ.

4. ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවෙහි ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින් 1974 ජනවාරි 15 වැනි දින පූ. භා. 10 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන වේලාව වන එදිනම අ. භා. 2.30 ට ටෙන්ඩර්කරුවනට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතවරුනට පෙනී සිටිය හැක.

5. වෙනත් අවශ්‍ය යම් විස්තරයක් වේ නම් එය පහත සඳහන් අයගෙන් ලබාගත හැකිය.

වැඩ බලන අධ්‍යක්ෂ.

10–679—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී පාද ස්ථානයට යන මාර්ගයේ දෙපස තිබෙන තාවකාලික වෙළඳසැල් සඳහා රජය සතු කඩ බිම් බදු දීම

ශ්‍රී පාදස්ථානයට යන මාර්ගය දෙපස තිබෙන මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රජයේ ඉඩම් 1973 වන්දනා කාලයේ දී තාවකාලික වෙළඳ සැල් (කඩ) පැවැත්වීම සඳහා බදු දීම පිණිස සීල් (මුද්‍රා) තබන ලද ඉල්ලුම් පත්‍ර (ටෙන්ඩර්) රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති විසින් භාර ගනු ලැබේ. මින් එක් එක් ඉඩම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම ඉල්ලුම් පත්‍ර එවිය යුතු වේ.

2. "ශ්‍රී පාද ස්ථානයට යන මාර්ගයේ කඩ බිම්" යන වැකිය ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරේ ලියා මුද්‍රා තබන ලද ඉල්ලුම් පත්‍ර 1973 නොවැම්බර් මස 15 වැනි දින සවස 2 වනතුරු භාරගෙන ඒ වේලාවට එම ලියුම් කඩා බලනු ලැබේ. ඉල්ලුම් පත්‍රයන්හි සත්‍යභාවය ඔප්පු කිරීම පිණිස, ඉල්ලුම්කරු හෝ ඔහුගෙන් බලය ලත් ඒජන්තකෙනෙක් ඒ වේලාවේ මෙම කච්චේරියට පැමිණිය යුතුයි. ටෙන්ඩර් පත්, රත්නපුර කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ ද තැන්පත් කළ හැක.

3. ඉල්ලුම් කරනු ලබන එක් එක් ඉඩම් කැබැල්ලක් සඳහා ඇප වශයෙන් රුපියල් විසි පහක (25) මුදලක් රත්නපුර කච්චේරියේ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලැබෙන කුවිතාන්සිය ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුයි. ඇප මුදල 1973 නොවැම්බර් මස 15 දින දවල් 12 ට පෙර තැන්පත් කළ යුතු වන අතර, එසේ ඇප තැන්පත් කරන අයට ටෙන්ඩර් පෝරම කච්චේරියෙන් නිකුත් කරනු ලැබේ.

4. තෝරා ගන්නා ලද ඉල්ලුම් පත්‍රයන්හි සඳහන් සම්පූර්ණ මුදල් ඉල්ලුම්කරුවන් විසින් එවේලේම ගෙවා බදු බලපත්‍ර ලබා ගත යුතුයි.

5. ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂෙප කිරීමේ සම්පූර්ණ බලය දිසාපති සතුය.

6. යම්කිසි ඉඩම් කැබැල්ලක් සඳහා ලැබී තිබෙන ඉල්ලුම් පත්‍ර නුසුදුසු වේ නම් එවැනි ඉඩම් සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමේ බලය දිසාපති වෙත වේ.

7. යම්කිසි ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් කීපයක් පිළිගැනීමෙන් පසුව වුවද, අවසථානුකූලව අවලංගු කළ යුතුයයි දිසාපතිට හැඟෙන්නේ නම් එසේ අවලංගු කිරීම සඳහා බලය දිසාපති සතුය.

8. සෑම කඩ ඕමකම ගොඩනැගිලි 1973 දෙසැම්බර් 15 දිනට පෙර සාදා නිම කිරීමට කටයුතු නොකළහොත්, එවැනි බිම් කට්ටිවල බද්ද අවලංගුකොට නැවත ටෙන්ඩර් කැඳවීමේ බලය දිසාපති සතුවේ.

9. තෝරා ගනු ලැබූ ඉල්ලුම්කරුවන් විසින් තම වෙළඳ සැලේ තිබෙන සෑම කෑම ද්‍රව්‍යයක්ම මැස්සන්ගෙන් ප්‍රවේසම් වීම සඳහා සුදුසු ආවරණ තැබිය යුතුයි. එසේ නොකළහොත් එම බදුකරය අවලංගු කිරීමට දිසාපතිට බලය තිබේ.

10. තෝරා ගනු ලැබූ සෑම ඉල්ලුම්කරුවකු විසින්ම තමා විසින් සාදන සෑම වෙළඳ සැලක් සඳහා සෞඛ්‍ය නිලධාරීන් අනුමත කරන පරිදි සිමෙන්ති කොන්ක්‍රීට් ලැලි තබන ලද තාවකාලික වැසිකිළියක් බැගින් සෑදිය යුතු වේ. එසේ කිරීමට ඇප වශයෙන් රුපියල් විසි පහක් (රු.25) එම ඉල්ලුම්කරු විසින් රත්නපුර කච්චේරියේ තැන්පත් කළ යුතුයි. එවැනි වැසිකිළි තැනුවහොත් ශ්‍රී පාද වන්දනා සමයෙන් පසුව මුදල් ආපසු ගෙවනු ලැබේ. එසේ නොකළහොත් වැසිකිළි තැනීම සඳහා එම මුදල් පාවිච්චි කරනු ලැබේ.

11. බදු ගන්නා සෑම ඉඩම් කැබැල්ලකින්ම 1974 ජූනි මස 1 වැනිදාට පෙර වෙළඳ සැල් සඳහා ඉදිකරන ලද ගොඩනැගිලි කඩා ගෙන, වැසිකිළි වසා දමා, අස්විය යුතුයි.

12. වැඩි විස්තර රත්නපුර කච්චේරියෙන් දැනගත හැකිය.

උපලේඛනය

**රත්නපුර ප්‍රා. ආ. නි. කොට්ඨාශය තුළ**

1. ලිනිපොල බිම් කැබලි 1 යි (මාගීයයට පැත්තේ)
2. ගැටනෙවුල බිම් කැබලි 1 යි.
3. මැල්ලමළකඳුර ඉඩම් කැබලි 1 යි.
4. ඉදිකටුපාන ගල්පොත්ත බිම කැබලි 1 යි.
5. පවනැල්ල ඉඩම් කැබලි 1 යි( දොරළ කඩේ.)
6. ධම්රාජගල ඉඩම් කැබලි 1 යි.
7. ගිනගඟුල ඉඩම් කැබලි 1 යි.
8. ගැටනෙවුල ඉස්මත්ත කොඩිය ගාව ඉඩම් කැබලි 1 යි.
9. හැරම්පිටපාන මැල්ලමළකඳුර අතර ගෝනාතැන්න හෙළතැන්න ඉඩම් කැබලි 1 යි.
10. ගුරුහෙල්ගල ඉස්මත්ත ඉඩම් කැබලි 1යි.
11. දියබෙත්ම නෝනාගේ අම්බලම ළඟ ඉඩම් කැබලි 1 යි.
12. පවනැල්ලේ 433 ප්ලැනයේ ලොට් නොම්මර 30 ඉඩම් කැබලි 1 යි.
13. පලාබද්දල කළුගගේ පාලම අසල 349 ප්ලෑනයේ ලොට් නොම්මර 749 දරණ බිම් කැබලි 1 යි.
14. හැරම්පිටපානේ මකර තොරණ ළඟ බිම් කැබලි 1 යි.
15. මාපනාන—අ.ග.සි. 435 ලොට් නොම්මර 5 ඉඩම් කැබලි 1 යි.
16. මාපනාන—අ.ග.සි. 435 ලොට් නොම්මර 19 තොටුපළ ළඟ බිම් කැබලි 1 යි.

**කුරුවිට උප දිසාපති කොට්ඨාශය තුළ**

17. ගල්වංගෙඩිය ඉඩම් කැබලි 1යි.
18. බේරුමන්ඩිය ඉඩම් කැබලි 1යි.
19. මැදගින්න ඉඩම් කැබලි 1 යි.
20. දෙමළමළගින්න ඉඩම් කැබලි 1 යි.
21. ඉදිකටුපාන ඉඩම් කැබලි 1 යි.
22. අ.ග.සි. 393 ලොට් නොම්මර 193 (වරිණගල අම්බලම අසල) ඉඩම් කැබලි 1 යි.
23. තුම්මෝදර එගොඩ ඉඩම් කැබලි 1 යි.
24. තුම්මෝදර මෙගොඩ ඉඩම් කැබලි 1 යි.

පියදාස, බමුණුසිංහ,
දිස්ත්‍රික් ඉඩම් නිලධාරී,
රත්නපුර දිසාපති වෙනුවට.

මගේ අංකය. ඉ/30/1/1/562.
1973 ඔක්තෝබර් මස 08 වෙනි දින,
රත්නපුර දිසාපති කාර්යාලයේදීය.

10-637—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම—1974

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1974 ජනවාරි මස 1 දින සිට 1974 දෙසැම්බර් මස 31 දින දක්වා (දෙදිනම ඇතුලුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන අයුරු දුම්රිය පොලේ සිට කිරි මධ්‍යස්ථානවලට පිරිසිදු එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර, වවුනියා සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—රුපියල් 100 ක තැන්පත් මුදලක් මා නමට ඕනෑම කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල, මඩකළපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම සහ රත්නපුරය යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි, පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙනු දෙවන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් හෝ ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වීමට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු කිරි ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි තුන්වන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''වවුනියා සෞඛ්‍ය සේවා අධිකාරි'' කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරෙහි එය කවර සේවාවක් සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහාලන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම සෞඛ්‍ය සේවා අධිකාරී තැනට බාරදී එය ලැබුන බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි හතරවන තීරයේ සඳහන් දිනයෙහි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මා විසින් බලය පවරනු ලබන නියෝජිතයකුගේ අනුමැතිය ඇතුව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කිරීම කළ හැකිය.

8. **ටෙන්ඩරයේ සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර පිළිපැදිය යුතු ද වේ.

11. **වෙනත් විස්තර.**—වැඩිදුර විස්තර දැනගැනීම සඳහා වවුනියාවේ සෞඛ්‍ය සේවා අධිකාරී තැන අමතන්න.

ටී. ෂන්මුගනාදන්,
වවුනියාවේ සෞඛ්‍ය සේවා අධිකාරි තැන.

1973 ඔක්තෝබර් 3 වැනි දින,
වවුනියාවේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දීය.

### උපලේඛනය

| (1) සේවාව | (2) පෙදෙස | (3) මාසයකට සැපයිය යුතු පයින්ට් ගණන | (4) අවසාන දිනය |
|---|---|---|---|
| 1. මාන්කුලම් දුම්රිය ස්ථානයේ සිට මුලතිව් සෞඛ්‍ය කාර්යාලයටත්, එතැන් සිට මුලතිව් දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරි තැනගේ කොට්ඨාශයට අයත් කිරි මධ්‍යස්ථානවලටත් පිරිසිදු එළකිරි ප්‍රවාහනය කිරීම ... ... ... ... ... ... | මුලතිව් ... | 7,000 | ... 14.11.73 |
| 2. මන්නාරම් දුම්රිය ස්ථානයේ සිට මන්නාරම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කාර්යාලයටත් එතැන් සිට මන්නාරම සෞඛ්‍ය වෛද්‍ය තැනගේ කොට්ඨාශයටත් අයත් කිරි මධ්‍යස්ථාන කරාත් පිරිසිදු එළකිරි ප්‍රවාහනය කිරීම ... ... ... ... | මන්නාරම ... | 10,000 | ... 14.11.73 |
| 3. වවුනියා රජයේ ගොවිපලේ සිට වවුනියා සෞඛ්‍ය කාර්යාලයටත් එතැන් සිට වවුනියා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කොට්ඨාශයට අයත් කිරි මධ්‍යස්ථාන කරාත් පිරිසිදු එළකිරි ප්‍රවාහනය කිරීම ... ... ... ... ... ... | වවුනියාව ... | 1,500 | ... 14.11.73 |

10–551—73.10.19 වැනි දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම—1974

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1974 ජනවාරි 1 වනදා සිට 1974 දෙසැම්බර් 31 වනදා දක්වා (දින දෙකමඇතුළත්ව) කාලය තුළ, මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර වවුනියාවේ සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ; ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම සහ රත්නපුරය යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ෆෝර්මයේ නොවනු මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර ෆෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ෆෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ෆෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් ෆෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා අවශ්‍ය ෆෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (ii) සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරි තැන, වවුනියාව " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව ප්‍රාදේශීය ලේකම්තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයෙහි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවා යේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් කර ඇති ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම් කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනසක් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබාගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුළ හෝ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. (i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3½ක් ඇතුළත් වන සේ බත් වේල සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(ii) දැනට ආහාර උපලේඛනයේ දක්වා ඇති සහල් අවුන්ස 12 ප්‍රමාණය අවුන්ස 7 වශයෙන් වෙනස් කර ඇති නිසා 1970 ඔක්තෝබර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීමට අනවශ්‍ය වනු ඇත.

(iii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිළට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු ආහාර කොමසාරිස් විසින් විටින්විට නියෝග කරන ලද මිළට මුදල් ගෙවිය යුතුය. පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිළයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිළට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ. යම්කිසි අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිළට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිළේ සහ සලාක මිළේ වෙනස කොන්ත්‍රාත් කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරනු ලැබේ.

(iv) කූපන් භාර නොදුනහොත් සේවකයින්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ :—

(අ) කූපන්වලට ලබාගන්නා සහල් දැන්ට මෙන් නොමිළයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිළට නම් නොසපයනු ලබන පාන්වල මිළෙත් සලාක සහල් මිළෙත් වෙනස අඩු කරනු ලැබේ.

ටී. ෂන්මුගනාදන්,
සෞඛ්‍ය සේවා අධිකාරී, වවුනියාව.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
වවුනියාව, 1973 ඔක්තෝබර් මස 3 වැනි දින.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප තැන්පත් මුදල රු. | (4) ටෙන්ඩර් අවසාන වන දිනය සහ වේලාව | (5) අවශ්‍ය ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින් | | | | | රෝගීන් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මාළු | මස් | බිත්තර | කරවල | එළවළු | මාළු | මස් | බිත්තර | කරවල | එළවළු |
| වවුනියාව කොට්ඨාශය— | | | | | | | | | | | | | |
| අඩම්පන් දි. රෝ. ... | 100 | 800 | | 1,800 | — | 700 | 300 | 2,100 | 2,650 | — | 1,250 | 500 | 3,750 |
| මුරුන්කන් ග්‍රා. රෝ. | 100 | 800 | | 1,050 | — | 520 | 525 | 1,560 | 2,000 | — | 525 | 230 | 2,150 |
| තලේමන්නාරම දි. රෝ. | 100 | 600 | | 400 | — | 400 | 720 | 1,200 | 360 | — | 360 | 720 | 1,080 |
| වෙඩිඩිකුලම් ග්‍රා. රෝ. | 100 | 800 | | 760 | — | 370 | 390 | 1,150 | 1,400 | — | 750 | 760 | 2,200 |
| පේසාලෙයි ග්‍රා. රෝ. | 100 | 600 | 14.11.73 | 850 | — | 400 | 420 | 1,225 | 700 | — | 340 | 400 | 1,100 |
| පුතුකුඩිරිප්පු ග්‍රා. රෝ. | 100 | 600 | පෙ.ව. | 80 | — | 75 | 150 | 240 | 115 | — | 100 | 210 | 350 |
| විලාවතුරෙයි ග්‍රා. රෝ. | 100 | 600 | 10.00 ට | 525 | 175 | 500 | 700 | 1,500 | 900 | 300 | 400 | 1,200 | 1,200 |
| විඩතල්තිව් ග්‍රා. රෝ. | 100 | 400 | | 480 | — | 250 | 250 | 840 | 1,325 | — | 700 | 720 | 2,050 |
| මාන්කුලම් මා. නි. ... | 100 | 400 | | 35 | — | 32 | 32 | 130 | 30 | — | 30 | 30 | 125 |
| නෙඩුන්කර්නි මා. නි. | 100 | 400 | | 135 | — | 36 | 35 | 35 | 110 | — | 55 | 70 | 50 |
| පූවරසන්කුලම් මා. නි. | 100 | 400 | | 90 | — | 45 | 70 | 130 | 60 | — | 20 | 25 | 800 |
| පාවට්කුලම් මා. නි. ... | 100 | 400 | | 40 | — | 20 | 20 | 60 | 65 | — | 30 | 35 | 60 |

10-552—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

යොමු අංකය : ඒ/9/73.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ලාදුරු මර්දන ව්‍යාපාරය, 385, ඩීන්ස් පාර, කොළඹ 10

**හැඳල ලාදුරු රෝහලට පලාපු දර සැපයීම**

1974 ජනවාරි මස 1 වැනිද සිට 1974 දෙසැම්බර් 31 වැනිදයින් අවසන් වන වර්ෂය තුළ මේ සමග ඇති උපලේඛනයේ පළමුවැනි තීරයෙහි දක්වා ඇති දර සැපයීම් සඳහා එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර ලාංකිකයින්ගෙන් හෝ ලාංකික ආයතන වලින් හැඳල ලාදුරු මර්දන ව්‍යාපාරයේ අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. මෙම කාර්යාලය මගින් සපයන ලද පෝර්ම වල පමණක් පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. මේ සමග ඇති උපලේඛනයේ 4 වෙනි තීරයෙහි සඳහන් දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර් කරුවෙකුට ටෙන්ඩර් පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් ලාදුරු මර්දන ව්‍යාපාරයේ අධිකාරි හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

4. මේ සමග ඇති උපලේඛනයේ දෙවැනි තීරයෙහි සඳහන් ප්‍රමාණයේ මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට නිකුත් කෙරෙන කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමට පළමුව ඉදිරිපත් කළ යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවා සංගම වලට අයිති සමිති වලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

5. අයදුම් කරුවන් විසින් තැන්පත් කරන ලද මුදලට ලබාගත් කුවිතාන්සි ටෙන්ඩර් පත්‍ර නිකුත් කෙරෙන අවසාන දිනට පෙර දින දවල් 12 ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය පෝර්ම ලබාගත යුතුයි. තැපැලෙන් පෝර්ම ඉල්ලුම් කරන අය, මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල් වේලා ඇතිව එවීමෙන් අවසාන දිනයට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය පෝර්ම ලබාගත හැකිය.

6. සියළුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු ලාදුරු මර්දන ව්‍යාපාරයේ අධිකාරි වෙත දන්විය යුතුය. මේ සඳහා අවශ්‍ය පෝර්ම එම කාර්යාලයෙන් ලබාගත හැක.

ටෙන්ඩර් කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දැනගැනීමට පෙර ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් පිළිබඳ තීරණයක් කළ නොහැකි බැවින් තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු කල් වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුයි.

7. සෑම ටෙන්ඩරයක්ම ඉහත සඳහන් ලාදුරු මර්දන ව්‍යාපාරයේ අධිකාරි තැනගේ නමට එවිය යුතුයි. සීල් තැබූ ටෙන්ඩර් පත්‍රය බහාලන කවරයේ වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න සඳහන් කළ යුතුයි. ඒ කවරයේ ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනයද සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත් එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලේකම් වරයාට පුද්ගලිකව භාරදීමෙන් හෝ එය ලැබුන බවට කුවිතාන්සියක් ද ලබාගත හැක. ටෙන්ඩර් කරුවන්ට තම ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපැලෙන් ද එවීමට පුළුවන. ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දින පෙරවරු 10 ට පසු තැපැලෙන් එවන හෝ පැමිණ භාර දෙන සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. මෙම ආයතනය සඳහා සැපයිය යුතු දර ප්‍රමාණය දළ වශයෙන් ආයතනය භාර වෛද්‍ය නිලධාරිතුමාගෙන් හෝ මෙම කාර්යාලයෙන් ලබාගත හැකිය.

9. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය.

10. කිසිම විමසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් හෝ කොටසක් භාර ගැනීමද නැතහොත් සියළුම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ බලයද රජය සතුව ඇත.

11. වැඩි විස්තර මෙම කාර්යාලයට අයදුම් පතක් එවීමෙන් දැනගත හැකිය.

ඩී. ඇස්. පී. සභාපති,
අධිකාරි,
ලාදුරු මර්දන ව්‍යාපාරය.

ලාදුරු මර්දන ව්‍යාපාරයේ අධිකාරි කාර්යාලය,
385, ඩීන්ස් පාර, කොළඹ 10,
1973.10.01.

**උපලේඛනය**

| ආයතනයේ නම සහ සේවය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | ඇප මුදල රු. | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය සහ වේලාව |
|---|---|---|---|
| හැඳල ලාදුරු රෝහලට පලාපු දර සැපයීම ... | 100 ... | 600 ... | 1973 නොවැම්බර් මස 20 වැනි දින පෙරවරු 10 ට |

10–636—73.10.19 දින අංක 82 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : ඒ. 10/73.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ලාදුරු මර්දන ව්‍යාපාරය, නො. 385, ඩීන්ස් පාර, කොළඹ 10

**කිළිටි රෙදි සේදීම**

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1974 ජනවාරි 1 වැනි දින සිට 1974 දෙසැම්බර් 31 වැනිදයින් (දින දෙකත් ඇතුළුව) අවසන් වන වර්ෂය තුල, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවැනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් සහ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ 10, ලාදුරු මර්දන ව්‍යාපාරයේ අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිති වලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් ද ආයතනය භාර වෛද්‍ය නිලධාරිගෙන් ද ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

3. **වත්කම් විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ, තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතුයි. මෙ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි වන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මෙ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා අධිකාරි, ලාදුරු මර්දන ව්‍යාපාරය, 385, ඩීන්ස් පාර, කොළඹ 10 කියා එවිය යුතුයි. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙලවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහා ලන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ලේකම් මහතාට හෝ මාහට දීමෙන් එය ලැබුණු බවට ඔහු හෝ මවිසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කරගැනීමට හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතුව හෝ ඒවායෙන් පිටපත් පරීක්ෂා කල හැක.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කල යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනිත් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසූ විට—

(අ) සලසන ලද ගබඩා පහසුකම් සඳහා පලාතේ ආදායම් පාලක නිලධාරිතුමාගේ තක්සේරු ගණන්වලට අනුව කොන්ත්‍රාත් කරුගේ වවුචරයෙන් මුදල් අයකරගනු ලැබේ.

(ආ) විදුලි බලය සඳහා සවිකර ඇති ''මීටර්'' වල සටහන් පරිදි අදාල මුදල් වවුචරයෙන් අයකරනු ලැබේ.

(ඇ) ජලය සඳහා පලාතේ ආදායම් පාලක නිලධාරි තුමාගේ තක්සේරු අනුව මාස් පතා වවුචරයෙන් මුදල් අයකර ගනු ලැබේ. තවද ජලය පාවිච්චි කල ප්‍රමාණය දැන ගැනීම සඳහා ''මීටර්'' සවිකල හොත් එහි සටහන් පරිදි අදාල මුදල් වවුචරයෙන් අයකිරීමට සිදුවනවා ඇත.

(ii) **කිලිටි රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙනයාමේ වියදම්.**—යම් අවස්ථාවක කිලිටි රෙදි සේදීමට පෙර ඒවා විෂබීජ නැසීම සඳහා ආයුතනයේ සිට වෙන විෂබීජ නාසක ස්ථානයකට ගෙන යාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතන සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුල ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

ඩී. ඇස්. පී. සභාපති,
අධිකාරි වෙනුවට,
ලාදුරු මර්දන ව්‍යාපාරයේ අධිකාරි.

ලාදුරු මර්දන ව්‍යාපාරයේ අධිකාරි කාර්යාලය,
නො. 385, ඩීන්ස් පාර, කොළඹ 10,
1973.10.09.

උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) මසකට රෙදි සේදිය යුතු වාර ගණන සාමාන්‍ය | (5) මසකට සේදිය යුතු කෑලි ගණන | (6) ටෙන්ඩර් භාරගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | | | |
| ලාදුරු රෝහල, හැඳල | 100 | 500 | 5 | 12,620 | 1973 නොවැම්බර් මස 15 වැනි දින පෙ.ව. 10 ට |

10–635—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය.

---

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

1974 ගබඩා බඩු ඇදීම—වවුනියා කොට්ඨාශය

**සේවය සහ ටෙන්ඩර් දැමීමට සුදුසු පුද්ගලයින්.**—මේ කාර්යාලයෙන් හෝ මෙහි මතු 2 වන ඡේදයේ සඳහන් කාර්යාලවලින් හෝ ඉල්ලා ලබා ගතයුතු උපලේඛනවල දක්වා ඇති තොරතුරු පරිදි, 1974.1.1 වනද සිට 1974.12.31 වනද දක්වා වකවානුව තුළ දුම්රිය පොළෙන්/පොළවලින් පෝළවලට/පොළට ආයතනවලින්/ආයතනවලට/කාර්යාලයට/කාර්යාල යෙහි ගබඩා බඩු ඇදීම සඳහා, ලාංකිකවූ පුද්ගලයින් ගෙනුත්, ලාංකික ව්‍යාපාර ආයතන වලිනුත්, සමුපකාර සමිතිවලිනුත් වවුනියා සෞඛ්‍ය සේවා අධිකාරි තැන වැන්ඩර් බාරගනු ඇත.

සඳහන් මිළ ගණනට කම්කරු ගාස්තු සහ පැටවීම් කුලිද ඇතුළත් විය යුතුයි.

2. වැන්ඩර් එවිය යුත්තේ ඊට නියමවූ ආකෘති පත්‍රය මතැයි. රු. 100ක මුදලක් ලඟම ඇති කච්චේරියේ වවුනියා සෞ. සේ. අධිකාරි නමට තැන්පත් කොට එහි ලදුපත ලබාගෙන වැන්ඩර් පත්‍ර නිකුත් කරනු සඳහා වැන්ඩර් කරු නිසි පරිදි අත්සන් කළ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඒ ලදුපත සමග ඉදිරිපත් කළ යුතුයි. වැන්ඩර් පත්‍ර 1973 නොවැම්බර් 13 වන පෙ.ව. 10 දක්වා මතු සඳහන් සෞ. සේ. අධිකාරි කාර්යාලවලින් ලබාගත හැකිය :—

අනුරාධපුර, ගාල්ල, කෑගල්ල, පුත්තලම, මඩකලපුව, යාපනය, කුරුණෑගල, රත්නපුර, බදුල්ල, කළුතර, මාතලේ, වවුනියා, කොළඹ, මහනුවර මාතර.

නියමිත ආකෘති පත්‍රයේ නොවන කිසිම ටැන්ඩරයක් සැලකිල්ලට ලක් නොවේ.

3. තමන් දෙපාර්තමේන්තුව සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳී ඇතත් නැතත් සියලු ටැන්ඩර්කරුවන් විසින් වටිනාකම පිළිබඳ වගතුග සැපයිය යුතුයි. මේ සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර ඉහත 2 වන ඡේදයෙන් කියවුනු කවර හෝ සෞ. සේ. අධිකාරී කාර්යාලයකින් ලද හැකිවේ.

4. එක් එක් පිටපතේ ටැන්ඩර්කරුගේ අත්සන ඇතිව දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතු ටැන්ඩර් පත්‍ර " බඩු ඇදීම සඳහා ටැන්ඩරය " යනුවෙන් වම්පැත්තේ උඩු කෙළවරේ සලකුණක් තබා වවුනියා සෞ. සේ. අධිකාරී වෙත පිට නම ලියූ කවරයෙක බහා අස්ඔබා (සීල් තබා) එවිය යුතුයි.

5. ටැන්ඩර් පත්‍ර 1973.11.14 වනදා පෙරවරු 10ට පෙර වවුනියා සෞ. සේ. අධිකාරී වෙත ලැබෙනසේ ඔහු වෙත පිට නම ලියා ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. නැතහොත් සෞ. සේ. අධිකාරී කාර්යාලයේ තිබෙන ටැන්ඩර් පෙට්ටියේ හෝ තැන්පත් කළ යුතුය. ටැන්ඩර්කරුවන් කැමති නම්, ටැන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කවරවලින් යුත්, අස් එබූ (සීල් තැබූ) ටැන්ඩර් පත්‍ර ඒ සෞ. සේ. අධිකාරී කාර්යාලවල ලේකම්/ගණකාධිකාරී වෙත භාරදී ඊට ලදුපතක් ලබාගැනීමට ටැන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට හෝ අවසර ඇත.

6. ටැන්ඩර් දමන මිළ ගණන් පැහැදිලි ඉලක්කමෙන් දක්වා වචනයෙන් ද නැවත ලියා තිබිය යුතුයි. වෙනස් කිරීම සහ මකා දැමීම් සියල්ල ටැන්ඩර් කරු විසින් අත්සන් තබා අනුමත කොට තිබිය යුතුයි. නැත්නම් ටැන්ඩර් පත්‍රය නොසරුප් සේ සලකා පිටු දකිනු ලැබිය හැකිය.

7. බඩු ඇදීම සඳහා සෑහෙන තරම් ප්‍රවාහණ පහසුකම් සැලසීමට ටැන්ඩර්කරුවන්ට පිළිවන්කම තිබිය යුතුයි. මේ මෙහෙය සඳහා යොදා ගැනිමට යන වාහනවල ස්වරූපය ටැන්ඩර් එවන විට දක්විය යුතුයි.

8. ටැන්ඩර් පත්‍ර 73.11.14 වනදා පෙරවරු 10 ට වවුනියා සෞ. සේ. අධිකාරී කාර්යාලයේදී විවෘත කරනු ඇත. ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ වරම්ලත් නියෝජිතයන්ට හෝ තමන් කැමැති නම්, වවුනියා සෞ. සේ. අධිකාරී සමග විධිවිධාන සලසා ගෙන ඔහුගේ අවසරය පිට, ටැන්ඩර් විවෘත කරන විට පෙනී සිටිමින් තමන් ඉදිරිපත් කළ ටැන්ඩරයේ දෙවන පිටපත පිරික්සිය හැකිය.

9. ටැන්ඩර්කරුවන්, තමන් ඉදිරිපත් කරන මිළ ගණන්, ටැන්ඩර් භාරගැනීම අවසන් වන දවසේ සිට හය මාසයක් දක්වා පිළිගත හැකි සේ තබාගත යුතුයි. ඉදිරිපත් කළ ටැන්ඩර් පත්‍ර පසුව, අස් කළ හැකි නොවේ.

10. වවුනියා සෞ. සේ. අධිකාරී ඉල්ලා සිටියොත්, තමන් ගන්නා කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට තමන් පොහොසත් බවට සාක්ෂි හැටියට ලියකියවිලි හෝ වෙනත් සාධක හෝ ඉදිරිපත් කිරීමට ටැන්ඩර්කරුවන් සූදනමින් සිටිය යුතුයි.

11. මේ කොන්ත්‍රාත්තුව යටතේ සිය කාරිය ඉටු කිරීමේදී ටැන්ඩර් කරු සේවයට ගත යුත්තේ ලාංකිකයන් පමණකි. මෙහිදී " ලාංකිකයා " යනුවෙන් හැඳින්වෙන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචියෙන් හෝ ලංකාවේ පුරවැසිකම ලැබූවෙකි. වවුනියා සෞ. සේ. අධිකාරීගේ අවසරය සහ අනුදැනුම කලින් නොලැබ ලාංකික නොවන කම්කරුවන් සේවයට ගැනීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළාක් සේ සළකා කොන් ත්‍රාත්තුව අවලංගු කො එහි කොන්දේසි ප්‍රකාර දඩයන්ට කොන්ත්‍රාත්කරු යටත් කළ හැකි වරදකි.

12. 1934 අංක 19 දරණ කම්කරු වන්දි මුදල් ආඥපනත හෝ එහි සංශෝධන, ලිහිල් කිරීම්, එකතු කිරීම් යන කිසිවක් හෝ යටතේ යම්කිසි සේවකයෙකු විසින් ඉදිරිපත් කරන්නට යෙදෙන යම් හිමිකමක් වෙතොත්, කොන්ත්‍රාත්කරු විසින් ඒ හැම දෙයකින්ම ආණ්ඩුව මුදගත යුතුයි.

13. වවුනියා සෞ. සේ. අධිකාරී තැන ඉල්ලා සිටින පරිදි මුළු කොන් ත්‍රාත්තුව හෝ ඉන් කොටසක් හෝ වෙනුවට රුපියල් 300 කට නොවැඩි ඇප මුදලක් තැබීම අවශ්‍ය වනු ඇත.

14. තෝරාගනු ලබන ටැන්ඩර්කරු, කොන්ත්‍රාත්තුව සතුටුදයක ලෙස ඉටු කරන බවට සෞ. සේ. අධ්‍යක්ෂ සමග කොන්ත්‍රාත්තුවකට බැඳිය යුතුයි. ටැන්ඩර්කරුගේ ටැන්ඩරය බාරගත් බව වවුනියා සෞ. සේ. අධිකාරී විසින් හෝ ඔහුගේ නිසි වරම් දරන නියෝජිතයෙකු විසින් හෝ ටැන්ඩර්කරුට දන්වා දස දිනක් ඇතුළතදී කොන්ත්‍රාත්තුවට අත්සන් කිරීමට හෝ නියමිත ඇප මුදල් තැබීමට හෝ ටැන්ඩර්කරු මැළිවුවහොත් හෝ අපොහොසත් වුවහොත් හෝ ඔහුගේ තැන්පත් මුදල රාජසන්තකවී රජයේ ගිවිසුම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත් කිරීමට ද හේතු වේ. ටැන්ඩරය බාරගත් බව දක්වෙන නිවේදනය ටැන්ඩර්කරු සිය ටැන්ඩරයේ දී ඇති ලිපිනයට තැපැලෙන් යවා තිබේ නම්, නැතහොත් ඒ ලිපිනය ඇති තැන දමා තිබේ නම්, එය ටැන්ඩර්කරුට ලැබුණු බව ගණන් ගනු ලැබේ.

15. වවුනියා සෞ. සේ. අධිකාරීගේ අවසරය කලින් නොගෙන මේ කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට පැවරීමට හෝ බෙදදීම හෝ නොකට යුතුයි. කොන්ත්‍රාත්කරුවෙකු තමන් වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කරනු පිණිස අන් අයෙකුට බලය පවරමින් නිකුත් කළ ප්‍රතිනිධි බලය නොපිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

16. වවුනියා සෞ. සේ. අධිකාරී තැන, සෑහෙතැයි තමන්ට පෙනෙන හේතු නිසා, තමා නම සඳහන් කරන කිසියම් පුද්ගලයකු/පුද්ගලයින් කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීම ගැන සිය විරුද්ධත්වය ලියවිල්ල කින් කොන්ත්‍රාත්කරු වෙත දන්වා සිටිකලැ ඒ කියන තැනැත්තා/තැනැත්තන් කිසිවෙකුත් කොන්ත්‍රාත්කරු විසින් සේවයට නොගත යුතුයි.

17. කිසිදු ප්‍රශ්නයක් නැතිව ටැන්ඩර් සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ පිටුදැකීමත්, යම් ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමත් රජය සතු අයිතියකි.

18. සෞ. සේ. අධ්‍යක්ෂ තැන සමග කොන්ත්‍රාත්කරු බැඳුණු ගිවිසුම ක්වරක් වුවද, තමන් කැමැති අන්දමකින්, තමන් කැමැති කෙනෙකු ලවා එකී වැඩ කොටස කරවා ගැනීමේ නිදහස වවුනියා සෞ. සේ. අධිකාරී වෙත තිබේ. එබඳු විටෙකදී වැඩ නැතිවීම නිසා තමන්ට වන පාඩුව පිරිමැසීමට යම්කිසි වන්දියක් හෝ අලාභයක් හෝ අඩුකිරීමක් හෝ වෙනත් සහනයක් හෝ ඉල්ලීමේ අයිතිය කොන්ත්‍රාත්කරුට නොලැබේ. ඔහු ඊට හිමිකරුවෙක්ද නොවේ.

19. ඉහතකී පරිදි කොන්ත්‍රාත්කරු වෙත පවරන ලද බඩු ගෙන ගොස් භාරදීමට කොන්ත්‍රාත්කරු දෙතුන් වතාවක් ප්‍රමාද වුවහොත් නැත්නම් අපොහොසත් වුවහොත් හෝ එකී කොන්දේසි කිසිවක් කඩ කළොත් හෝ ඔහු කොන්ත්‍රාත්තුව ඉටු නොකළාක් සේ සළකනු ලැබේ. තවද, කොන්ත්‍රාත්තුව ඉටු කරන බවට ඔහු ඇපය හැටියට තැන්පත් කළ මුදලද රජය සතුවී, රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින්නන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත් වීමට ඉඩ තිබේ.

20. ලංකාණ්ඩුවේ නීති මේ කොන්ත්‍රාත්තුවට අදාළ වෙයි.

21. ටැන්ඩර්කරුවන් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි හොඳින් දැන සිටිය යුතුයි. තොරතුරු නොදත් බව හෝ ප්‍රමාණවත් නොවූ බව හෝ කියා ඉදිරිපත් කරන මැසිවිලි කිසි කලෙකත් සළකා බලනු නොලැබේ.

22. මෙහිලා සඳහන් සියලු කොන්දේසි අකුරටමැ සපුරා නැතහොත් කිසිදු ටෙන්ඩරයක් සළකා බලනු නොලැබේ.

23. ටැන්ඩර්කරුවන්ට දැනගැනීමට අවශ්‍ය වැඩි විස්තර යමක් වෙතොත්, ඉහත 2 වැනි ඡේදයේ දක්වෙන කාර්යාලවලින් ඉල්ලා ලබාගත හැකිය.

24. **දුර ප්‍රමාණය කිට්ටුවෙන්.**——දුම්රිය පෙළවල/අතුරු පොළවල සිට ආයතනවලට/කාර්යාලවලට කොපමණ දුරක් තිබේ ද යන වග මේ සමග ඇති උපලේඛනයේ දක්වේ. මෙහි දක්වෙන දුර ප්‍රමාණය නිරවද්‍යතාවය ගැන දෙපාර්තමේන්තුව වග නොකියයි.

25. **ගබඩා/බඩු යනාදිය නැතිවීම නිසා මුදල් අයකිරීම.**— කොන්ත්‍රාත් කරු විසින් ගෙනගොස් බාරදිය යුතු බඩු බාහිරාදිය හෝ ඉන් යමක් හෝ නැතිවුවහොත්, හෝ සොරකම් කරනු ලැබුවහොත් හෝ බඩු බාහිරාදියට අලාභයක් හානියක් සිදුවුවහොත් හෝ ඒ හේතුවෙන් රජයට දැරීමට සිදුවන රේගු බදු යනාදිය කිසිවක් වෙතොත් එය ද ඇතුළත් කොට, අලාභහානි සිදුවූ හෝ සොරකම් කරන ලද හෝ නැතිවූ බාහිරාදියෙහි මුළු වටිනාකම දෙපාර්තමේන්තු ගාස්තුත් සමග දෙපාර්තමේන්තුවට ගෙවීමට කොන්ත්‍රාත් කරු බැඳී සිටී.

26. දක්විය යුතු මිළ ගණන් :

(අ) (i) බඩු ඇදීම සඳහා මෙසේ වැටි 10 ක් යටතේ එක් එක් බර ගොල්ල වෙනුවෙන් මිළ ගණන් බී—I උපලේඛනයෙහි දක්විය යුතු :—

පළමුව රාත්තල් 28 දක්වාද,
දෙවනුවැ රාත්තල් 28ට වැඩියෙන් රාත්තල් 56 දක්වා ද,
තුන්වැනුවැ රාත්තල් 56 ට වැඩියෙන් රාත්තල් 84 දක්වාද,
සිව්වැනුවැ රාත්තල් 84 ට වැඩියෙන් හොණ්ඩර 1 දක්වාද,
පස්වැනුවැ හොණ්ඩර 1 ට වැඩියෙන් හොණ්ඩර 1½ දක්වාද,
හයවැනුවැ හොණ්ඩර 1½ ට වැඩියෙන් හොණ්ඩර 2 දක්වාද,
හත්වැනුවැ හොණ්ඩර 2 ට වැඩියෙන් හොණ්ඩර 2½ දක්වාද,
අටවැනුවැ හොණ්ඩර 2½ ට වැඩියෙන් හොණ්ඩර 3 දක්වාද,
නමවනුවැ හොණ්ඩර 3 ට වැඩියෙන් හොණ්ඩර 3½ දක්වාද,
දසවනුවැ හොණ්ඩර 3½ ට වැඩියෙන් හොණ්ඩර 4 දක්වාද වේ.

(ii) එක් බඩු පොදියක් මුළු දුරමැ ගෙනැ යාම සඳහා එක් එක් බරගොල්ල උදෙසා මිළ ගණන් දක්විය යුතුයි.

(iii) මුදල් ගනු ලබන්නේ, ඉහත වැටි ක්‍රමයේ දක්වෙන දුර කුමක් වුවද මුළු දුර ප්‍රමාණයම ගෙන යන ලද එක් එක් බඩු පොදි ගමන අනුවැයි.

(iv) එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට අඩුනම්, ඒවායේ ගෙවීම් බී—I උපලේඛනය යටතේ විය යුතුයි. එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට වැඩිවේ නම් ඒවායේ ගෙවීම තොග ප්‍රවාහණ ගෙවීම් යටතේ බී—II උපලේඛනය යටතේ විය යුතුයි.

(ආ) හොණ්ඩර 4ක් හෝ ඊට වැඩියෙන් හෝ බරක් ඇති බඩු තොග මුළු දුරම ගෙන යෑම සඳහා මතු සඳහන් වැටි 4 යටතේ බී—II උපලේඛනයෙහි මිළ ගණන් දක්විය යුතුයි.

(1) හොණ්ඩර 4කට වැඩියෙන් හොණ්ඩර 10 දක්වා,

(2) හොණ්ඩර 10කට වැඩියෙන් හොණ්ඩර 15 දක්වා,

(3) හොණ්ඩර 15කට වැඩියෙන් හොණ්ඩර 20 දක්වා,

(4) ටොන් 1කට වැඩියෙන්.

ටෙන්ඩර්කරුවන් විසින් මුළු දුරමැ ගෙන යාම සඳහා ඒ ඒ වැටි යටතේ මිළ ගණන් වෙන වෙනමැ දක්විය යුතුයි. මුදල් ගෙවනු ලබන්නේ වැටි 4 යටතේ මුළු දුරමැ සඳහා හොණ්ඩරයකට දක්වූ මිළ ගණන් මතැ අනුප්‍රමාණ ක්‍රමය උඩයි. හොණ්ඩරයක කොටසක් රාත්තල් 56කට වැඩි නම් එය හොණ්ඩරයක් සේ සැළකෙයි, නොඑසේ නම් ඊට මුදලක් ගෙවනු නොලැබේ.

(ඈ) සඳහන් කර ඇති මිළ ගණන් සාධාරණ වියයුතු අතර යාබද බර කාණ්ඩ අතර අනවශ්‍ය පරිදි මිළ වැඩි විය යුතු නොවේ.

27. මේ දන්වීම මෙහි පහත අඩ තබා ඇති තැනෙහි ටැන්ඩර්කරුගේ අත්සන තබා ටැන්ඩර් පත්‍රයත් සමග වවුනියා සෞඛ්‍ය සේවා අධිකාරී වෙත ආපසු එවිය යුතුයි.

ටී. ෂන්මුගනාදන්,
වවුනියා සෞඛ්‍ය සේවා අධිකාරී.

1974 ඔක්තෝබර් මස 3 වැනි දින.

————————,
නිකුත් කරන නිලධාරියාගේ අත්සන.

දිනය : 197————.

————————,
ටැන්ඩර්කරුගේ අත්සන.

දිනය : 197————.

### ගබඩා බඩු ප්‍රවාහණය කිරීමේ ටෙන්ඩර් කොන්දේසිවල 24 වැනි වගන්තියේ සඳහන් උපලේඛනය—1974

වවුනියාව සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශය—දුම්රිය ස්ථානවල සිට ආයතනයන්ට ඇති දුර ප්‍රමාණය—දළ වශයෙන්

| දුම්රිය ස්ථානයේ සිට | ආයතනයට | දළ දුර ප්‍රමාණය |
|---|---|---|
| **I ගණය** | | |
| වවුනියාව දුම්රිය ස්ථානය | වවුනියාව දිස්ත්‍රික් රෝහල | සැතපුම් ¾ |
| | වවුනියාව සෞඛ්‍ය කාර්යාලය | සැතපුම් ¾ |
| | වවුනියාව සෞ. සේ. අධිකාරී කාර්යාලය | සැතපුම් ¾ |
| | පූවර්සම්කුලම් මාතෘ නිවාසය | සැතපුම් 9 |
| | ඉරනිඉලුපයිකුලම් මධ්‍යම බෙහෙත් හල | සැතපුම් 18 |
| | පාවක්කුලම් මා. නි. සහ ම. බෙ. | සැතපුම් 11 |
| ඕමන්දයි දුම්රිය ස්ථානය | ඕමන්දයි මධ්‍යම බෙහෙත් හල | සැතපුම් ¼ |
| | පුලියන්කුලම් මධ්‍යම බෙහෙත් හල | සැතපුම් ½ |
| | නෙදුන්කර්නි මාතෘ නිවාසය | සැතපුම් 12 |
| මාන්කුලම් දුම්රිය ස්ථානය | මධ්‍යම බෙහෙත් හල, කොක්කිලායි | සැතපුම් 52 |
| | මුලතිව් දිස්ත්‍රික් රෝහල | සැතපුම් 30 |
| | මුලතිව් සෞඛ්‍ය කාර්යාලය | සැතපුම් 30 |
| | මාන්කුලම් මාතෘ නිවාසය | සැතපුම් ½ |
| | පුතුකුඩියිරිප්පු ග්‍රාමීය රෝහල | සැතපුම් 40 |
| | මුලියවලයි මධ්‍යම බෙහෙත් හල | සැතපුම් 25 |
| | නඩන්කන්ඩල් මධ්‍යම බෙහෙත් හල | සැතපුම් 13½ |
| **II ගණය** | | |
| වෙඩ්ඩිකුලම දුම්රිය ස්ථානය | වෙඩ්ඩිකුලම ග්‍රාමීය රෝහල | සැතපුම් 1 |
| නේරියකුලම දුම්රිය ස්ථානය | නේරියකුලම මධ්‍යම බෙහෙත් හල | සැතපුම් 1 |
| මුරුන්කන් දුම්රිය ස්ථානය | මුරුන්කන් රජයේ රෝහල | සැතපුම් 2 |
| | විලාවතුරෙයි ග්‍රාමීය රෝහල | සැතපුම් 10 |
| | මරිච්චුකඩ්ඩි මධ්‍යම බෙහෙත් හල | සැතපුම් 25½ |
| | නානත්තාන් මධ්‍යම බෙහෙත් හල | සැතපුම් 5¼ |
| මඩුපාර දුම්රිය ස්ථානය | පෙරියමඩු මධ්‍යම බෙහෙත් හල | සැතපුම් 23 |
| | පෙරියපන්ඩිවිරිච්චන් මධ්‍යම බෙහෙත් හල | සැතපුම් 11 |
| **III ගණය** | | |
| මන්නාරම දුම්රිය ස්ථානය | මන්නාරම මූලික රෝහල | සැතපුම් 2 |
| | මන්නාරම සෞඛ්‍ය කාර්යාලය | සැතපුම් 2 |
| | වෙල්ලාන්කුලම් මධ්‍යම බෙහෙත් හල | සැතපුම් 28 |
| | විඩතල්තිව් ග්‍රාමීය රෝහල | සැතපුම් 16 |
| පේසාලෙයි දුම්රිය ස්ථානය | පේසාලෙයි ග්‍රාමීය රෝහල | සැතපුම් ½ |
| තලයිමන්නාරම දුම්රිය ස්ථානය | තලයිමන්නාරම දිස්ත්‍රික් රෝහල | සැතපුම් ½ |
| තෝඩ්ඩවෙලි දුම්රිය ස්ථානය | එරුක්කුලම්පිඩි මධ්‍යම බෙහෙත් හල | සැතපුම් 1¼ |
| තිරුකේශ්වරම් දුම්රිය ස්ථානය | වන්කාලයි මධ්‍යම බෙහෙත් හල | සැතපුම් 2½ |
| | තිරුකේශ්වරම් මධ්‍යම බෙහෙත් හල | සැතපුම් 5 |
| මාන්තෝට්ටම් දුම්රිය ස්ථානය | මාන්තොට දිස්ත්‍රික් රෝහල | සැතපුම් 5 |

10-550—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී පාදස්ථාන මාර්ගය දෙපස රජයේ ඉඩම් තාවකාලික වෙළඳ සැල් (කඩ) සඳහා බදුදීම, 1973-74

මස්කෙළිය හරහා ශ්‍රී පාදස්ථානයට යන මාර්ගයේ දෙපස තිබෙන මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රජයේ ඉඩම් 1973-74 වන්දනා කාලයේදී තාවකාලික 'වෙළඳ සැල්' (කඩ-සඳහා බදුදීම පිණිස මුද්‍රා (සීල්) තබන ලද ඉල්ලුම්පත්‍ර (ටෙන්ඩර්) 1973 නොවැම්බර් මස 16 වෙනි දින පෙරවරු 10 දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති විසින් භාරගනු ලැබේ. එදින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

2. "ශ්‍රී පාදස්ථානයට යන මාර්ගයේ වෙළඳ සැල් පැවැත්වීම සඳහා ටෙන්ඩර්" යන වැකිය ලියුම් කවරයේ වම්පස මුදුනේ ලිවිය යුතුය. තවද මෙහි පහත උපලේඛනයේ සඳහන් එක් එක් ඉඩම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම ඉල්ලුම්පත්‍ර, ඉල්ලුම් කරන ඉඩම් කැබැල්ල පැහැදිලිව සඳහන් කොට ඉදිරිපත් කළ යුතුය.

3. පහත උපලේඛනයේ සඳහන් එක් එක් බිම් කොටස ඉදිරියෙන් දක්වා ඇති මුදල් ප්‍රමාණයට අඩු ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. ටෙන්ඩර්පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ මහනුවර කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ කළ හැකිය.

5. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ ඒ සඳහා නියමිත ෆෝර්මයේ ය. ඉල්ලුම්කරන එක් එක් ඉඩම් කැබැල්ලක් සඳහා රු. 50ක මුදලක් මෙම කච්චේරියේ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලැබෙන කුවිතාන්සිය මෙම කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත හැකිය. 1973 නොවැම්බර් මස 15 වෙනි දින දහවල් 12 වනතුරු ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

6. ඉල්ලුම් පත්‍රයේ මැකීමක් කොට හෝ වරදක් කොට, හෝ වරදක් නිවැරදි කොට ඇතොත් ඒ ස්ථානයේ ඉල්ලුම්කරුගේ කෙටි අත්සන යෙදිය යුතුය. ඉල්ලුම් කරන බදු මුදල අකුරෙන් හා ඉලක්කමෙන් සඳහන් කළ යුතුය. යම් හෙයකින් අකුරෙන් සඳහන් මුදල ඉලක්කමෙන් සඳහන් මුදලට වෙනස් වේ නම් නිවැරදි සේ පිළිගනු ලබන්නේ අකුරෙන් සඳහන් මුදල ය.

7. මෙම විස්තර පත්‍රයේ එකද කොන්දේසියකට හෝ අනුකූලතාවය නොදක්වන ඉල්ලුම් පත්‍රයක් වේ නම් එය සැලකිල්ලට භාජන කරනු නොලැබේ.

8. ටෙන්ඩර් පිළිබඳ වැරදිකරුවන්ගේ ලැයිස්තුවෙහි නම සඳහන් කිසිදු ඉල්ලුම්කරුවෙකුගේ ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. තවද දැනට බද්දට ලබාගත් ඉඩම් කැබැලිවල කඩ සාදා ඇති අයගෙන්ද ඔවුන්ගේ නියෝජිතයන්ගෙන්ද ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ. ලියාපදිංචි කළ සමුපකාර සමිතිවලින්ද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

9. ඉල්ලුම් පත්‍ර භාරගත් පසු එම ඉල්ලුම්කරු විසින් මුළු බදු මුදලම, දැන්වීමක් එවීමෙන් දින 7ක් ඇතුළත තැන්පත් කොට අවශ්‍ය බදු බලපත්‍ර ලබා නොගතහොත් ඉල්ලුම්පත්‍ර අවලංගු වනු ඇත.

10. තෝරාගත් ඉල්ලුම්කරුට ඉඩම් කැබැල්ල පිළියෙල කිරීම සඳහා අඩි 30×40 ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලක් සුද්ධ කළ හැකිය.

11. තෝරාගත් ඉල්ලුම්කරු විසින් රජයේ ඉඩමකින් ලී කැපීම හෝ රජයේ ඉඩමක් අවසර නොලබා එළිකිරීම නොකළ යුතුය. අවසර නැතිව රජයේ ඉඩම්කින් ලී නොකැපීම සහ ආරක්ෂා විධිවිධානයක නියායයෙන් තෝරාගත් ඉල්ලුම්කරු විසින් රු. 100ක මුදලක් කච්චේරියේ තැන්පත් කළ යුතුයි. මේ කොන්දේසිය සතුටුදායක අන්දමින් අනුගමනය කළහොත් එසේ තැන්පත් කළ මුදල බද්ද අවසානයේදී ඉල්ලුම්කරුට ආපසු දෙනු ලැබේ.

12. තෝරාගත් ඉල්ලුම්කරු විදුලිය දෙපාර්තමේන්තුව මගින් පොලොව යටින් දමා ඇති විදුලි කම්බිවලට කිසිදු අනතුරක් නොකළ යුතුය.

13. තෝරාගත් ඉල්ලුම්කරු තමාගේ කඩයේ ඇති කෑම, මැස්සන් ආදී රෝග බෝකරණ සතුන්ගෙන් ප්‍රවේශම්ව තබා ගත යුතුය. තවද, මෙම කෑම වර්ග හා ඒවා තබා ඇති අන්දම සෞඛ්‍ය නීති රීතින්ට එකඟ විය යුතුය.

14. සෞඛ්‍ය නිලධාරීන්ගේ උපදෙස් අනුව සෑම කඩයක් වෙනුවෙන්ම අඩු වශයෙන් (සිමෙන්ති ලෑල්ලක් සහිත) එක වැසිකිළියක්වත් තිබිය යුතුය. තෝරාගත් ඉල්ලුම්කරු මේ කොන්දේසි මත එක කඩයක් වෙනුවෙන් රු. 75ක් කච්චේරියේ තැන්පත් කළ යුතුය. වර්ෂ 1974 ජනවාරි මස 1 වෙනි දිනට පෙර සෞඛ්‍ය නීති රීතින්ට එකඟව වැසිකිළියක් සාදා නිම කළහොත් මේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. නැතහොත් මේ මුදල වැසිකිළියක් සෑදීම සඳහා වැය කරනු ඇත.

15. ඉතා අඩු වශයෙන් 1974 ජූනි මස 1 වෙනි දිනට පෙර බද්දට ගත් ඉඩම් කැබෙල්ල අත්හැර දැමිය යුතුයි. තෝරාගත් ඉල්ලුම්කරු බද්ද අත්හැර දැමීමට පෙර සෞඛ්‍ය නිලධාරීන්ගේ මතයට සරිලන සේ කඩය කඩා දමා ස්ථානය සුද්ධ පවිත්‍ර කොට වැසිකිළි වළවල් ආදිය වසා දැමිය යුතුයි. මෙසේ නොකළහොත් රු. 75 තැන්පත් මුදල රාජසන්තක වේ.

16. ඉල්ලුම්පත්‍රයක කොටස් පිළිගැනීමේ හෝ ඉල්ලුම්පත්‍ර ඇතමක් ප්‍රතික්ෂේප කිරීමේ අවිවාදාත්මක බලය මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති කෙරෙහි පවතී.

17. මේ පිළිබඳ වැඩිදුරටත් විස්තර මහනුවර දිසාපතිගෙන් ලබා ගත හැකිය.

උපලේඛනය

| | ටෙන්ඩර් කළ හැකි අඩුම මුදල රු. | ශ. |
|---|---|---|
| 1. ගඟුලේ තැන්නේ, නිස්සංක ලෙන අසල ළිඳ අසල පිහිටි ඉඩම ... | 75 | 0 |
| 2. තැන්න—කුරුණෑගල දන්සලට අඩි 125ක් පහලින් පිහිටි ඉඩම ... | 1,000 | 0 |
| 3. තැන්න—කුරුණෑගල දන්සලට අඩි 75ක් පහලින් පිහිටි ඉඩම ... | 1,000 | 0 |
| 4. තැන්න—කුරුණෑගලට දන්සලට අඩි 75ක් ඉහළින් පිහිටි ඉඩම | 375 | 0 |
| 5. ඉදිකටු පහන සහ තැන්න අතර පිහිටි ඉඩම (විදුලි පහන් කණුව හා ළිඳ ඉදිරිපිට) ... | 1,250 | 0 |

බී. බුළුමුල්ල,
මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1973 ඔක්තෝබර් මස 06 වෙනි දින,
මහනුවර දිසාපති කාර්යාලයේදීය.

10–559—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

#### බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1974 ජනවාරි 1 වැනිදා සිට 1974 දෙසැම්බර් 31 වැනිදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර බදුල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද, තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දහවල් 12 වන තුරු, මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර්

හා ගිස් සිමෙන්ති මළ මිළදී
ිරීම—1974

අමාත්‍යාංශයේ මධ්‍යම දිසාවේ
ායේ ටෙන්ඩර් මණ්ඩලයේ

ලාංකිකයින්ගෙන් හා ලාංකික
ු ලැබේ.

සාන වනුයේ 1973 නොවැම්බර්
අතර රු. 100ක මුදලක් තැන්
ා සිට 1973.11.29 දින දක්වා
බවට ලබාගත් කුවිතාන්සියක්

ඉදිරිපත් කිරීමෙන් මධ්‍යම දිසාවේ වැඩ අධ්‍යක්ෂ කායභාලයෙන් ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට පිළිවන.

3. මසකට හෝ ඊට වැඩි කාලසීමවකට දිර්ඝ කිරීමේ බලය රජයට ඇතිව කොන්ත්‍රාත් තුවේ කාලසීමාව වසරකට සීමා කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් ටෙන්ඩර් විවෘත කිරීමේ දිනයේ සිට සති හතරක කාලයක් තුල විවෘතව තැබිය යුතුය.

4. වැඩි විස්තර කුණ්ඩසාලේ පිහිටි මධ්‍යම දිසා වැඩ අධ්‍යක්ෂ කායභාලයෙන් ලබාගත හැකිය.

සී. වී. ඉ. රෝසා,
මධ්‍යම දිසාවේ වැඩ අධ්‍යක්ෂ
හා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති.

මධ්‍යම දිසාවේ වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
කුණ්ඩසාලේ,
1973 ඔක්තෝබර් මස 6 වන දින.

10-703—73.10.19 දින අංක 82 දරන ගැසට් පත්‍රය

---

ායේ මධ්‍යම දිසා කායභාලය,
ලේ

ායක ඉංජිනේරු කායභාලයන්හි
ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර්
ෂ හා ටෙන්ඩර් මණ්ඩලයේ සභා
ා දින පෙ. ව. 10 තෙක් භාර
ර්ට වැඩි මුදලකට ලියාපදිංචි වී
ර්ධන සමිති හා සමූපකාර සමිති
රිපත් කළ හැක :—

ගෙදර, ගම්පොල, කඩුගන්නාව,
ළිය, වලපනේ, හගුරන්කෙත,
ාල හා දඹුල්ල.

සෙයින් ප්‍රවාහන ලොරි දෙකක්
තමාගේ නමින් ලියාපදිංචි කර
ඉදිරිපත් කළ යුතුය. එවැනි
දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයෙන්
වනු ඇත.

කොන්ත්‍රාත් කරුවෙකුට ප්‍රාදේශීය කායභාල එකකට හෝ ඉන් වැඩි ගණනකට ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට හැකිවන අතර එක් ප්‍රාදේශීය කායභාලයක් සඳහා ලොරි දෙක බැගින් යෙදවීමට හැකියාවක් ඇති බව ඔප්පු කළ යුතුයි.

මේ සඳහා ටෙන්ඩර් පත් ඉල්ලුම් කිරීමේදී දැනට තමා නිරතව සිටින රජයේ වැඩ පිළිබඳ විස්තර හා ඒ ඒ ප්‍රධානීන්ගෙන් ලබාගත් සහතික පත් පරීක්ෂා කර බැලීම සඳහා මෙම කායභාලයට ඉදිරිපත් කළ යුතු වන්නේ ය. ටෙන්ඩර් පත් නිකුත් කිරීමේ අවසාන දිනය 1973 නොවැම්බර් 29 වන දින වන අතර කච්චේරියක, දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයක හෝ මෙම කාර්යාලයේ රු. 25 ක් තැන්පත් කර මේ සඳහා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු වන්නේ ය. වෙනත් විස්තර මෙම කායභාලයෙන් ඉල්ලුම් කළ් විට ලබා ගත හැක.

සී. වී. ඉ. රෝසා,
මධ්‍යම දිසාවේ වැඩ අධ්‍යක්ෂ
හා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති.

10-702—73.10.19 දින අංක 82 දරන ගැසට් පත්‍රය

---

විල් ඉංජිනේරු සංවිධානය

ග අමාත්‍යාංශයේ මධ්‍යම දිසාවේ
ඩර් මණ්ඩලයේ සභාපති විසින්
ාන/යන්ත්‍ර හා කාර්මික යන්ත්‍රෝ
ප්‍රමාණයන් නිගමනය කිරීම සඳහා
ද සමාගම්වලින් ටෙන්ඩර් පත්

ය පරිදි සම්පූර්ණ දිසාව සඳහා
න් කිරීම.

ලගෙදර, ගම්පොල, කඩුගන්නාව,
ුවරඑළිය, වලපනේ හගුරන්කෙත
තාට, ලග්ගල සහ දඹුල්ල ආදී
ඳහා වෙන් වෙන්ව මිළ ගණන්

2. මේ සඳහා 1973.12.7 දින පෙ.ව. 10 දක්වා සීල් තබන ලද ටෙන්ඩර් පත් භාර ගනු ලබන අතර එදිනම ඒවා විවෘත කරනු ලැබේ.

3. මේ ටෙන්ඩරය පිළිබඳ කොන්දේසි ආදිය 1973.12.6 දින දක්වා කුණ්ඩසාලේ පිහිටි දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේදී බලා ගැනීමට අයදුම්කරුවන්ට හැකි වන අතර ටෙන්ඩර්පත් නිකුත් කිරීමේ අවසාන දිනය 1973.12.6 දින වේ. ටෙන්ඩර්පතක් ලබා ගැනීමට කැමති අයදුම්කරුවන් විසින් එක් ටෙන්ඩර් පත්‍රයක් සඳහා රු. 25 ක ගාස්තුවක් ගෙවිය යුතුය.

සී. වී. ඉ. රෝසා,
මධ්‍යම දිසාවේ වැඩ අධ්‍යක්ෂ.

කුණ්ඩසාලේ.

10-701—73.10.19 දින අංක 82 දරන ගැසට් පත්‍රය

---

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—යාපනයේ කොට්ඨාශය

කිළිටි රෙදි සේදීම

ගේ සුදුසුකම්.—1974 ජනවාරි 1 වෙනි දින සිට 1974 දෙසැම්බර් 31 වනදායින් (දින දෙකත් ඇතුලුව) අවසන් වන
ලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික
ා ලද ටෙන්ඩර් පත්‍ර යාපනයේ සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාර ගනු ලැබේ.

මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට

ම් අවසාන දිනට පළමු දිනයෙහි දහවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ බදුල්ල, මඩකලපුව, අනුරාධපුර, කොළඹ,
, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වව්නියාව යන ස්ථානයන්හි පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි
ාබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා
ු බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර බාර ගැනීමට සැලකියයුතු කාලයකට පළමු තම වත්කම මට දන්විය යුතුය. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහාපෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වූවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමඟ ඇති උපලේඛනයේ 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරී, යාපනය" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර්පත බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාව ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුවාගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ප්‍රාදේශීය ලේකම් මහතාට දීමෙන් එය ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර්පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර්පත් භාරගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර්පත් විවෘත කිරීම.**—ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිත යෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂාකළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය පිළිගත් දින සිට දින 10ක් ඇතුළත මෙහි පහත පෙනෙන උපලේඛන යෙහි 3 වන තීරයෙහි සඳහන්වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන්වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත්යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැපවුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිළධාරිතුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

(ii) **කිළිටු රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙනයාමේදී වියදම්.**—යම් අවස්ථාවක කිළිටු රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩලවල ඇති ආයතනයන්ට ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ ඒ ඒ මංඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට උවමනානම් කොටසක් හෝ සෑම කොටස්ම ඒවාට නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

පි. රත්නසභාපති,
සෞඛ්‍ය සේවා අධිකාරී, යාපනය.

1973 ඔක්තෝබර් මස 08 දින,
යාපනයේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය.

උපලේඛනය

| සේවය | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ඇප මුදල රු. | මසකට සේදිය යුතු වාර | මසකට සේදිය යුතු කෑලි ගණන සාමාන්‍ය | ටෙන්ඩර් අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| **දිස්ත්‍රික්ක රෝහල, කෙල්ලිපලේ** | | | | | |
| පිරිමි වාට්ටු (වෛද්‍ය), ගැහැණු වාට්ටු (වෛද්‍ය), බාහිර රෝගීන්ගේ අංශය, ශල්‍යකර්මාගාරය, ඇක්ස්රේ අංශය, රසායනාගාරය, මාතෘ වාට්ටුව, මුළුතැන්ගෙය, දන්ත චිකිත්සාගාරය හා හෙදි නිවාසය, මානසික වාට්ටු (පිරිමි සහ ගැහැණු) ... ... | 50 ... | 100 ... | 4 ... | 4,200 | 1973.11.20 දින පෙරවරු 10 ට |
| **මහ රෝහල, යාපනය** | | | | | |
| අංශ 1—මාතෘ වාට්ටු අංක 1 සහ 2, ළමා වාට්ටු අංක 9... ... | 50 ... | 100 ... | 15 ... | 23,000 | |
| අංශ 2—ස්ත්‍රී ශල්‍ය වෛද්‍ය වාට්ටු අංක 3 සහ 4 ස්ත්‍රී චිකිත්සාගාරය වාට්ටු අංක 5 ශල්‍ය වාට්ටුව සහ කන්, නාස, උගුරු, වාට්ටු අංක 6 පිරිමි ශල්‍ය වෛද්‍ය වාට්ටු අංක 18 ... ... ... | 50 ... | 100 ... | 4 ... | 9,000 | |
| අංශ 3—ස්ත්‍රී වෛද්‍ය වාට්ටුව, අංක 10 ස්ත්‍රී අක්ෂි වාට්ටුව, අංක 12 පිරිමි වෛද්‍ය වාට්ටුව, අංක 14 පිරිමි ශල්‍ය වෛද්‍ය වාට්ටුව, අංක 17 රසායනාගාර කාමරය, විකිරණ දෙපාර්තමේන්තුව, අභ්‍යන්තර බෙහෙත්හල, ලේ බැංකුව සහ බාහිර රෝගීන්ගේ අංශය, අක්ෂි සහ කන්, නාස, උගුරු චිකිත්සාගාරවල හෙදපාලිකා නිවාස, මාණ්ඩලික හෙද නිවාස, මුළුතැන් හා අනිකුත් ... ... | 50 ... | 100 ... | 4 ... | 12,000 | |
| අංශ 4—ශල්‍ය වෛද්‍ය කාමරය ... ... ... | 50 ... | 100 ... | 15 ... | 11,000 | |
| අංශ 5—ගෙවන වාට්ටුව අංක 7, විකලාංග වාට්ටු අංක 8, පිරිමි අක්ෂි වාට්ටුව අංක 9, උරස්තල වාට්ටුව අංක 16, ස්නායු, ශල්‍ය වෛද්‍ය අංක 15 සහ බෝවෙන රෝග වාට්ටුව අංක 19... ... | 50 ... | 100 ... | 4 ... | 7,000 | |

10–641—73.10.19 දින අංක 82 දරන ගැසට් පත්‍රය

### ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, 200, කිරුළ පාරේ, ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා 1973 නොවැම්බර් මස 21 වෙනි දින පෙරවරු 10 වනතෙක් සීල් තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් භාරගනු ලැබේ.

| වැඩ විස්තරය | කොන්ත්‍රාත් කරුවන්ගේ අවම ලියාපදිංචි සීමාව |
|---|---|
| 1. කඩුගන්නාව ඩිපෝවේ භූමියේ පස් කපා සමතලා කිරීම—ඉසී/566 | රු. 75,000 |
| 2. හොරෙව්පතාන ඩිපෝ භූමිය පස් කපා සමතල කිරීම—ඉසී/540 | රු. 25,000 |
| 3. ඔරුගොඩවත්ත ඩිපෝවේ භූමිය පස් පුරවා සමතලා කිරීම—ඉසී/565 | රු. 75,0000 |
| 4. අක්මීමන ඩිපෝව — ගොඩනැගිලි ඉදිකිරීම—ඉසී/567 | රු. 50,000 |
| 5. දඹුල්ල ඩිපෝව—වැඩමඩු ඉදිකිරීම ඉසී/518 | රු. 100,000 |
| 6. අම්බලන්ගොඩ ඩිපෝව—ගොඩනැගිලි ඉදිකිරීම ඉසී/533 | රු. 125,000. |
| 7. ගාල්ල ප්‍රාදේශීය වැඩපොළ—ගොඩනැගිලි ඉදිකිරීම—ඉසී/542 | රු. 25,000 |

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල පිළියෙල කොට අනු පිටපතින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළයුතුය. අවශ්‍ය සියලුම විස්තර ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි අතර, අදාල සැළසුම් ආදිය ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. ලංගම රජයේ දෙපාර්තමේන්තුවල හෝ පිළිගත් සංස්ථාවල සිවිල් ඉංජිනේරු වැඩ සඳහා එක් එක් වැඩයට ඉදිරියෙන් පෙන්වා ඇති හෝ ඊට අධිකව ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති. අවශ්‍ය ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කිරීම සඳහා ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් වැඩ අංක : 1, 2, 3, 4 සහ 7 සඳහා එකකට රුපියල් 100 බැගින් ද, 5 සඳහා රු. 300 බැගින් ද, 6 සඳහා රු. 200 බැගින් ද ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ෆෝර්ම ගාස්තු වශයෙන් වැඩ අංක 1, 2, 3, 4 සහ 7 සඳහා රු. 25 බැගින් ද, 5 සඳහා රු. 60 බැගින් ද, 6 සඳහා රු. 40 බැගින් ද ප්‍රධාන ගිනුම් නිලධාරි තැන වෙත 1973 නොවැම්බර් මස 20 දින දහවල් 12ට හෝ ඊට පෙර ගෙවා, එම කුවිතාන්සි මා වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. තවද, ටෙන්ඩර්කරුවන් සුදුසුදැයි පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ සහතික ගිණුම් නිලධාරි තැන වෙත මුදලින් තැන්පත් කළ හැක්කේ එම සහතික පත් පිළිගනු ලැබුවේනම් පමණි.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

අංක 200, කිරුළ පාර,
කොළඹ 5.

10-646—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

## තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම

### පොලිස් දෙපාර්තමේන්තුව

1973.07.20 දින නිකුත්වූ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ කරන ලද පහත සඳහන් භාණ්ඩ සඳහාවූ ටෙන්ඩර් තීරණ.

| භාණ්ඩ | ලැබුණු මිළ ගණන් | භාරගත් ඒකක මිළ රු. ශ. | තෝරාගත් ටෙන්ඩර් කරු පිළිබඳ විස්තර |
|---|---|---|---|
| ඉනපටි ගාංචු | 4 | 7 50 | කිව්. නානායක්කාර මහතා, 6, පරණ කැස්බෑව පාර කට්ටිය හන්දිය, නුගේගොඩ |
| නිල තොප්පි ලාංඡන | 5 | 2 0 | එම |
| ගමනාගමන පාලන ලාංඡන | 4 | 2 50 | එම |
| නිලධාරීන්ගේ මෙස් බොත්තම් | 1 | 1 85 | ද සිටි ට්‍රේඩිං කොම්පැනි, 113, කෙළින් වීදිය, කොළඹ 11 |
| පොලිස් පරීක්ෂකවරුන්ගේ මෙස් බොත්තම් | 1 | 1 95 | එම |
| අනික් නිලයන්ගේ බොත්තම් (කුඩා) | 2 | 1 70 | එම |
| අනික් නිලයන්ගේ බොත්තම් (ලොකු) | 2 | 1 95 | ලීලා ඉන්ඩස්ට්‍රීස්, 400, බ්ලුමෙන්ඩල් පාර, කොළඹ 13 |

ජී. පුංචිමහත්මයා,
පොලිස්පති වෙනුවට.

1973 ඔක්තෝබර් මස 09 වැනිදින,
කොළඹ 1,
පොලිස් මූලස්ථානයේ දීය.

10-682—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

### පොලිස් දෙපාර්තමේන්තුව

සපත්තු ඔප දැමීමේ ද්‍රව්‍ය සැපයීම සම්බන්ධයෙන්

1973. 04.06 දින නිකුත් වූ රජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ කරන ලද ටෙන්ඩරය අවලංගු කරන ලදී.

ජී. පුංචිමහත්මයා,
පොලිස්පති වෙනුවට.

පොලිස් මූලස්ථානය,
කොළඹ 1,
1973 ඔක්තෝබර් මස 09 වන දින.

10-681—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

### පොලිස් දෙපාර්තමේන්තුව

කැප් තොප්පි 10,000ක් සැපයීම සම්බන්ධයෙන්

73.03.30 දින නිකුත් වූ රජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ කරන ලද ටෙන්ඩරය අවලංගු කරන ලදී.

ජී. පුංචිමහත්මයා,
පොලිස්පති වෙනුවට.

පොලිස් මූලස්ථානය,
කොළඹ 1,
1973 ඔක්තෝබර් මස 09 වන දින.

10-680—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

# බඩුබාහිරාදිය විකිණීම්

## රේගුවේ වෙන්දේසියක්

පහත සඳහන් භාණ්ඩ 1973 ඔක්තෝබර් මස 30 වැනි දින පෙරවරු 9.30 ට, ශ්‍රී ලංකා රේගුවේ, එෆ් 2 විකුණුම් ශුදමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1973 ඔක්තෝබර් මස 29 වැනි දින පෙරවරු 10 සිට පස්වරු 3 දක්වා ගැණුම්කරුවන්ට මෙම භාණ්ඩ පරීක්ෂාකර බැලීමට පිළිවන.

යම් භාණ්ඩයක් විකුණා අවසන් වූ වහාම එම භාණ්ඩය මිලදී ගත් තැනැත්තා විසින් ඊට අදාල සියයට පණහක මුදලක් තැන්පත් කල යුතුය.

වෙන්දේසිය පිළිබඳ අනිකුත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වැනි දින අංක 10,675 දරන ගැසට් පත්‍රය බලන්න.

ඩී. පී. මීගොඩ,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : පීඕ/විකිණීම්/68/73.
1973.09.27 වැනි දින,
කොළඹ, ශ්‍රී ලංකා රේගුවේ,
නිවාරන කාර්යාලයේ දීය.

1. කරාබු නැටි ගෝනි 6 ක් (රාත්තල් 600 ක්),
2. නයිලෝන් මාළු දැල් මිටි 8 ක්,
3. අව් කණ්නාඩි 3 ක්,
4. ගිනි පෙට්ටි 25 ක්, කෘතිම මල් අං 12 ක්, පින් අරින උපකරන 4 ක්, සිගරැට් දල්වීමේ උපකරන සහිත සිගරැට් කොපු 1ක්, ඩූයර පෙට්ටි 1 ක්, සබන් කෑලි 3 ක්, මහතුන්ගේ සපු ලේන්සු 6 ක්, 7'0 ක්ලොක් බ්ලේඩ් තල පහකින් යුත් පැකට් 2 ක්, විල්කින්සන් බ්ලේඩ් තල පහකින් යුත් පැකට් 3 ක්,
5. වටකුරු ඔර්ලෝසු විදුරු 5 ක්, දිගැති ඔර්ලෝසු විදුරු 4 ක්, ඔර්ලෝසු දුනු 5 ක්, ඔර්ලෝසු කොටස් 5 ක්, ඔර්ලෝසු ක්‍රියා කරවන යතුරු 5 ක්,
6. ඩී. ඩී. එල්. රීස්ට් වින් 1 ක්,
7. නික්සෝඩම් පින් 24 ක් (එකක් අවුන්ස 9/16),
8. කප්ලින්ක්ස් 288 ක්, ටයි ඇමුණුම් (ටයික්ලිප්ස්) 1075 ක්,
9. රබර් සෙරෙප්පු කුට්ටම් 7 ක්,
10. 'සී. ගල්' ලැන් විදුලි පන්දම් 25 ක්,
11. සිගරැට් කඩදාසි පැකට් 7 ක්,
12. බයිසිකල් පිටුපස ඇක්සලේ සහිත හබ් 1 යි,
13. නයිලෝන් දැල් නූල් රෝල් 16 ක්,
14. "fයින්ට් වට් 40" ක්ලබ් කමිස 2 යි,
15. පින්තාරු බුරුසු 2 ක්, කපු නූල් රෝල් 2 ක්, ගල්කුරු 54 ක්, රෝලර් බෙයාරිං 1 ක්, ගියර් ලිවර් උඩ කොටස් 1 ක්, සායම් වෙනස් වූ පොප්ලින් යාර 2 කේ කෑලි 1 ක්, පලුදුවූ කපු සූට් රෙදි කෑලි 2 ක් (යාර 2 යි),
16. බයිසිකල් හබ්කැප්ස් 550 ක්,
17. කපුනූල් පන්දු 3 ක්,
18. නෝනාමහතුන්ගේ අකුලන කුඩ 1 ක්, 'රොන්සන්' සිගරැට් දැල්වීමේ උපකරන 1 ක්, 'කැනි' සිගරැට් දල්වීමේ උපකරන 1 ක්, නයිලෝන් ඔර්ලෝසු පටි 51 ක්, හම්පටි 2 ක්, (ශ්‍රවන් විදුලි යන්ත්‍ර), ඉයර්පෝන් 2 ක්, ඔර්ලෝසු කොටස් 6 ක්,
19. ක්‍රියා විරහිත පාවිච්චි කරන ලද නෝනාමහතුන්ගේ අත් ඔර්ලෝසු 2 ක්,
20. ක්‍රියා විරහිත මහතුන්ගේ දින සහිත 'සිකෝ' ඔර්ලෝසු 1 ක්,
21. ක්‍රියා විරහිත මහතුන්ගේ 'ඔටිස්' ඔර්ලෝසු 1 ක්,
22. කැඩුනු, මහතුන්ගේ 'සී ගල්' අත් ඔර්ලෝසු 1 ක්, මහතුන්ගේ ඔර්ලෝසු පටි 4 ක්,
23. කරාබු නැටි ගෝනි 14 ක් (රාත්තල් 600)
24. දිරාපු වොයිල් රෙදි කෑලි 8 ක් (එකක් යාර 30 ක්),
25. ප්ලාස්ටික් ඔර්ලෝසු විදුරු 1127 අඩංගු පෙට්ටි 94 ක්,
    ඇස්. ඇන්. ආර් ප්ලාස්ටික් ඔර්ලෝසු විදුරු 1153 ක්, වොෂර් පැකට් 97 ක්, ඔර්ලෝසු කොපු 13 ක්, ඔර්ලෝසු කටු 112 ක්,
    ඔර්ලෝසු ඩයල් 1477 ක්, ප්ලාස්ටික් ඔර්ලෝසු විදුරු 84 ක්, ඉසකේ දුනු පැකට් 24 ක්, කරකවන බොත්තම් පැකට් 10ක්,
    කරකවන බොත්තම් පැකට් 7 ක්, ඔර්ලෝසු කොටස් පැකට් 6 ක්, (ස්ටෙම්ස්),
    ඔර්ලෝසු දුනු 285 ක්, ලෝහ ස්ප්‍රින්ස් පැකට් 3 ක්,
    බැලන්ස් ව්‍යාප් පැකට් 27 ක්, ලෝහ වොෂර් 113 ක්,
    පටි ඇමුණුම් පැකට් 9 ක්, වොෂර් පැකට් 200 ක්, ටුවීසර් 1 ක්, ආවුද 13 ක්, ඔර්ලෝසු ඉඳිකටු පැකට් 4 ක්, ඔර්ලෝසු පටි පැකට් 15 ක්,
    වොෂර් අඩංගු නල 6 ක්, දුනු පැකට් 1 ක්, වොෂර් පැකට් 50 ක්,
    ඔර්ලෝසු කටු පැකට් 11 ක්, ඔර්ලෝසු කටු පැකට් 39 ක්, ඔර්ලෝසු කටු විශාල පැකට් 7 ක්,
    රෝද පැකට් 2 ක්, ඔර්ලෝසුවලට සවිකරන මැණික්ගල් සහිත නල 262 ක්,
    ස්කුරුප්පු ඇන පැකට් 50 ක්, ඔර්ලෝසු ඩයල් 77 ක්,
26. නාන කාමරවලට අවශ්‍ය උපකරණ (ඉන්ටර්සෙප්ටර්ස්) 5 ක්, ප්ලාස්ටික් පන්දු 5 ක්, සනීපාරක්ෂක භාණ්ඩ කෑලි 10 ක්,
27. රෙදි කවරයක් සහිත මුවහත් ගල් 4 ක්,
28. රාත්තල් 112 ක පොල්කටු අඟුරු ගෝනි 1 ක්,
29. රාත්තල් 112 ක සුදු සිමෙන්ති ගෝනි 1 ක්, පයිප්ප සවිකරන කෑලි 2 ක් , නූල් පන්දු 3 ක්,
30. ඔර්ලෝසු පටි 87 ක්,
31. නයිලෝන් යාර 10 ක්, හැට්ට රෙදි කෑලි 5 ක් (යාර 14 යි),
32. බෑග් (ඇටැච් කේස්) 1 ක්,
33. එතනෝල් බෝතල් 8 ක්,
34. බෝල් රේසර් 6 ක්, මුරච්චි 3 ක්, යතුරු 1 ක්, පියන් 1 ක්, බයිසිකල් කොටස් කෑලි 18 ක්
34. (බී) ඇන්ටිමොනි රාත්තල් 8 ක්,
35. රැවුලබාන උපකරණ (රේසර්) 17 ක්,
36. තඹ කෑලි 4 ක් (රාත්තල් 28 ක්),
37. මෝර වරල් මිටි 4 ක්,
38. පාස්සන ඊයම් කම්බි රෝල් 402 ක්,
39. මාපක යන්ත්‍ර 1 ක්, අලියා ලකුණ දරන හිස් බෝතල් 8 ක් සමග පං මල්ලක්,
40. දිරාපු කෘතිම ලේස් යාර 28 ක්,
41. ඔර්ලෝසු පටි 24 ක්,
42. ප්ලාස්ටික් ඔර්ලෝසු පටි 4 ක්,
43. වින්ඩ්ස්ක්‍රීන් වයිපර්ස් 8 ක්, මෝටර් කාර් අමතර කොටස් කෑලි 2 ක්,
44. රැවුලබාන උපකරණ 4 ක්,
45. කපු 'ටී' කමිස 4 ක් (ප්‍රමාණය 16),
46. ප්ලැනල් කමිස 2 ක්,
47. සීත කමිස 3 ක්,
48. පාවිච්චි කරන ලද කපු කමිස 8 ක්,
49. ඔර්ලෝසු පටි 30 ක්,
50. ඔර්ලෝසු පටි 20 ක්,
51. විදුලි සුවිච් 168 ක්,
    ඩබල් හෝල්ඩර්ස් 8 ක්,
    30 ඒ. සී. පී. සුවිච් 4 ක් සූට් කේස් එකක් සමග,
52. නෝනා මහතුන්ගේ පනා 8 ක්,
    ප්ලාස්ටික් කෑලි 5 ක් (යාර 32), මලකඩන ලද යතුරු සහිත ඉබ්බන් 19 ක්, අවු කණ්නාඩි 2 ක්, නිය සායම් (නේල් පොලිස්) කුප්පි 1 ක්, වලලු 2 ක්, කොණ්ඩ කටු 4 ක්, සුවඳ විලවුන් බෝතල් 4 ක්, කුම් කුම් පෙට්ටි 1 ක්, රැවුල බාන උපකරන 1 ක්, ඔර්ලෝසු පටි එකක්, ලේස් කෑලි 1 ක් (යාර 3),
53. කාඩ්ස් කුට්ටම් 1 ක්,
54. එලාස්ටික් රෝල් 4 ක් (අඩි 206),
    ටු වේ වැල්ව් 1 ක්,
55. රෙඩ් හාට් නූල් පන්දු දුසිම් 1 ක්,
56. එකක බ්ලේඩ්තල 2 කින් යුත් ගිලට් රේසර් 6 ක්, රිස්ලර් සිගරැට් කඩදාසි පැකට් 12 ක්,
57. 7 අප් බෝතල් 2 ක්, කොලොන් බෝතල් 2 ක්,
58. පාවිච්චි කරන ලද කමිස 1 ක්,

59. අව් කණ්නාඩි 73 ක්, ඔර්ලෝසු කොපු (කේසස්) 36 ක්, නයිලෝන් නූල් පන්දු 1 ක්, නයිලෝන් ඔර්ලෝසු පටි 36 ක් ෆන්නා මහතුන්ගේ ඔර්ලෝසු පටි 48 ක්, මහතුන්ගේ ඔර්ලෝසුපටි 98 ක්.

60. ජල උෂ්ණ මාපක යන්ත්‍ර 2 ක්, තෙල් තෙරපුම් මාපක යන්ත්‍ර 2 ක්, ජල තෙරපුම් මාපක යන්ත්‍ර 2 ක්, පේල්ට් සමග ටයිම් සුවිච් 2 ක්, ක්‍රියාකරවන යතුරු 1 ක් (යතුරු සමග), විදුලි යතුරු 2 ක්, ගෑස් සංඥ ලාම්පු 1 ක්.

61. චීනයේ නිෂ්පාදිත දලිපිහි 23 ක්, කෝප්මන් දලිපිහියා 9 ක්, පසිලව් උල්පත් පෑන් 104 ක්, (අනුකරන), චීන උල්පත් පෑන් 5 ක්,

62. වෙම්බ්ලි බිත්තිඔර්ලෝසු 1 ක්,

63. ඔර්ලෝසු පටි 44 ක්, අනුකරන මාල 6 ක්, ඔප දමූ මාල 78 ක්, රැවුල බාන උපකරන 6 ක්, 'ගිලට්න්' රැවුලබාන උපකරන 15 ක්, ඉබියතුරු 318 ක්, වලලු ජෝඩු 66 ක්,

64. 'ගිලට්න්' රැවුලබාන උපකරන 24 ක්,

65. පර්කින්ස් 3 එන්ජිමකින් යුත් ධීවර බෝට්ටු 1 ක්,

66. පිග්මන්ට් පේෂ්ට් ටින් 1 ක්,

67. 'සිටිසන්' ඔර්ලෝසු පටි 1 ක්,

68. ටී. ටී. එන්. 149 දරණ රුවල් බෝට්ටු 1 ක්,

69. එන්ජිම සහිත ධීවර බෝට්ටු 1 ක්,

70. කැඩුන ප්ලග් 21 ක් සහිත ඇහුරුම් පෙට්ටිය සහ ඉබියතුර,

71. රාත්තල් 130 ක් බරැති වැල් ඕන් කුරු පැකට් 17 ක්.

10-598—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

## කණුවන මහේස්ත්‍රාත් උසාවියේ භාණ්ඩ වෙන්දේසිය

රාජ සන්තක කරන ලද සහ අයිතිවාසිකම් ඉදිරිපත් නොකරන ලද පහත සඳහන් භාණ්ඩ, කල්වේලා ඇතිව අයිතිවාසිකම් ඉදිරිපත් කර එම භාණ්ඩ ලබා නොගතහොත්, එම භාණ්ඩ 1973 ඔක්තෝම්බර් 31 වැනි දින ප.ව. 1 ට කණුවන මහේස්ත්‍රාත් උසාවි භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු බව මෙයින් දන්වමි.

වෙන්දේසියේ සාර්ථක ඉල්ලුම්කරුවන් විසින් මිලදී ගන්නා ලද භාණ්ඩ සඳහා ඒ අවසානවේදීම නියමිත මුදල් ගෙවා එම භාණ්ඩ වහාම උසාවි භූමියෙන් ඉවත් කළ යුතුයි.

ස. සෙමසිංහ,
මහේස්ත්‍රාත්, කණුවන.

1973 ඔක්තෝම්බර් 05 වැනි දින,
කණුවන මහේස්ත්‍රාත් උසාවියේදීය.

### පාපැදි

| නඩු අංකය | වර්ගය | පාපැදි අංකය |
|---|---|---|
| ඒ.ආර්. 1911–68 ... | — | ... ඒ.වයි. 96515 |
| ඒ.ආර්. 2165–68 ... | — | ... — |
| ඒ.ආර්. 2210–69 ... | — | ... බී.බී. 76767 |
| ඒ.ආර්. 2715–70 ... | — | ... ටී.ජේ.ඒ. 24445 |
| ඒ.ආර්. 2740–70 ... | — | ... ජී. 344267 |
| ඒ.ආර්. 2991–71 ... | (ප්‍රේම) | ... ඩී.ඇල්. 862 |
| ඒ.ආර්. 2993–71 ... | (රැලේ) | ... ඒ.යූ. 94300 |
| ඒ.ආර්. 7998–71 ... | රැලේ | ... 69 බී. 12 |
| ඒ.ආර්. 3018–71 ... | — | ... — |
| ඒ.ආර්. 3029–71 ... | හම්බර් | ... ඇෆ්. ඊ. 9128 |
| ඒ.ආර්. 3118–71 ... | — | ... සී.ඉසෙඩ්. 1462 |
| ඒ.ආර්. 5294–73 ... | — | ... එස්. 37124 |
| ඒ.ආර්. 5534–73 ... | රැලේ | ... ආර්.ආර්. 47401 |
| ඒ.ආර්. 5534–73 ... | රැලේ (ප්‍රේම) | ... ඩී.ඇල්. 63067 |
| ඒ.ආර්. 5534–73 ... | රජ් | ... ඊ.ඇෆ්. 37010 |
| ඒ.ආර්. 5543–73 ... | රැලේ | ... ඒ. 35117 |
| ඒ.ආර්. 5515–73 ... | — | ... ඩී.ඇල්. 37752 |

| නඩු අංකය | වර්ගය | පාපැදි අංකය |
|---|---|---|
| ඒ.ආර්. 5733–73 ... | රැලේ | ... 60 ඇම්. 1000 |
| 17256 ... | — | ... ඩී. ජේ. 275 |
| 17905 ... | හම්බර් | ... බී.ඇම්. 82032 |
| 18652 ... | හර්කියුලස් | ... ඇන්.ඒ. 732 |
| 19274 ... | රැලේ | ... බී.ඩබ්ලිව්. 88831 |
| 19474 ... | — | ... එන්. 22741 |
| 20426 ... | හර්කියුලස් | ... ආර්.අයි. 521 |
| 20356 ... | මොනරා | ... බී.ඇම්. 178 |
| 20428 ... | රැලේ | ... ඩී.ඇන්. 78810 |
| 22004 ... | — | ... 731 |
| 22044 ... | — | ... බී.ඇෆ්. 55389 |
| 22285 ... | — | ... ටී.කේ. 482 |
| 22303 ... | — | ... ඩී.ඇන්. 48102 |
| 23958 ... | රැලේ | ... ඩබ්ලිව්.එච්. 1453 |
| 25811 ... | රැලේ | ... පී.ඒ. 15489 |

### වෙනත් භාණ්ඩ

| | |
|---|---|
| 17661 ... | අඟල් 9½ක් දිග යකඩ පැතලි කැල්ලක් |
| | යකඩ අඬුවක් |
| 23489 ... | යකඩ අඬුවක් |
| | පයිප්ප අඬුවක් |
| | ස්පැනර් දෙකක් |
| 25459 ... | පැට්රෝමැක්ස් ලාම්පුවක් (පරණ) |
| 24879 ... | බස්රථවල ගියර් බොක්ස් කවර 6 ක් |
| 15425 ... | ක්‍රියා විරහිත ට්‍රාන්සිස්ටර් ගුවන්විදුලි යන්ත්‍රයක් |
| 17899 ... | විදුලි පන්දමක් |
| | අත් ඔරලෝසුවක් (පිරිමි) |
| ඒ.ආර්. 3348–72 ... | මාළු දැල් 3ක් |
| — | උදලු එකයි |
| | කුලු ගෙඩියක් |
| | ප්ලාස්ටික් කෑන් |

0-5 96—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

## ගම්පොල මහේස්ත්‍රාත් උසාවිය

### ප්‍රදර්ශණ භාණ්ඩ වෙන්දේසිය

ගම්පොල මහේස්ත්‍රාත් උසාවියේ රාජසන්තක කරන ලද අයිතිවාසිකම් ඉදිරිපත් නොකරන ලද සහ හිමිකරුවන් විසින් නියමිත කාල සීමාවක් තුළදී ඉවත් කර නොගන්නා ලද භාණ්ඩ 1973 ඔක්තෝබර් මස 26 වෙනි දින පෙ.ව. 9 ට ඉහත සඳහන් ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් දන්වා සිටිනු ලැබේ.

වෙන්දේසියේදී මිළ දී ගන්නා බඩුවලට මුදලින් ගෙවීම් කළ යුතු අතර වෙන්දේසිය අවසානයේ දී එදිනම බඩු ඉවත් කර ගත යුතුය.

ප්‍රාදේශීය උසාවි පාලන ලේකම්.

1973 ඔක්තෝබර් මස 02 වැනි දින,
මහනුවර, ප්‍රා. උ. පා. ලේකම් කාර්‍යාලයේ දීය.

### ගම්පොල මහේස්ත්‍රාත් උසාවියේ රාජසන්තකකරන ලද බඩුබාහිරාදිය

### වෙන්දේසි කිරීමේ ලැයිස්තුව

| නඩු අංකය | භාණ්ඩ විස්තර |
|---|---|
| 1. ඒ.ආර්. 1660/72 | කාර් රථ හබ් (1යි) එකයි |
| 2. ඒ.ආර්. 607/71 ... | කාර් රථ හබ් (1යි) එකයි |
| 3. ඒ.ආර්. 671/71 ... | — |
| 4. ඒ.ආර්. 2120/73 ... | හුලං පොම්ප (1යි) එකයි |
| 5. ඒ.ආර්. 1752/72 ... | පිහිය (1යි) එකයි |
| 6. ඒ.ආර්. 935/72 ... | පිත්තල කලය (1යි) එකයි |
| 7. ජේ. 228 ... | පිත්තල සොයිබ (3යි) තුනයි |
| | පිත්තල දොර හැන්ඩ්ල් (2යි) දෙකයි |
| | පිත්තල ඇණ (4යි) හතරයි |
| | පිත්තල ජනෙල් හැන්ඩ්ල් (2යි) දෙකයි |
| | ඉස්කුරුප්පු නියන් (2යි) දෙකයි |
| 8. ඒ.ආර්. 2361/73 ... | පයිප්ප කෑලි (8යි) අටයි |

| නඩු අකය | | භාණ්ඩ විස්තර |
|---|---|---|
| 9. 26379 | ... | එස්. ආර්. දත් බෙහෙත් පියුබ් (3යි) තුනයි |
| 10. 27376 | ... | හිස්ගෝනි (13යි) දහතුනයි |
| 11. 26943 | ... | වොයිල් රෙදි යාර (13½) දහතුනහමාරයි |
| 12. 23004 | ... | අබ රාත්තල් (17යි) දහහතක් (පමණ) |
| 13. 26687 | ... | මැන්ටල් (1යි) එකයි |
| 14. 28392 | ... | මැන්ටල් (1යි) එකයි |
| 15. 22177 | ... | සරොම් (18යි) දහඅටයි |
| 16. 29786 | ... | ලී කෑලි 10 × 7 (4යි) හතරයි |
| | | ලී කෑලි 8 × 6 (5යි) පහයි |
| | | ලී කෑලි 9 × 1 (1යි) එකයි |
| | | රීප්ප කෑලි (20යි) විස්සයි |
| | | රීප්ප කෑලි (30යි) තිහයි |
| 17. 29522 | ... | ලී කෑලි 2 × 6 (7යි) හතයි |
| | | ලී කෑලි 2 × 5 (2යි) දෙකයි |
| | | ලී කෑලි 2 × 4 (4යි) හතරයි |
| | | ලී කෑලි 2 × 4 (2යි) දෙකයි |
| | | ලී කෑලි 2 × 4 (2යි) දෙකයි |
| | | ලී කෑලි 3 × 4 (1යි) එකයි |
| | | ලී කෑලි 3 × 4 (2යි) දෙකයි |
| | | ලී කෑලි 2 × 4 (39යි) තිස්නමයයි |
| | | ලී කෑලි 4 × 2 (5යි) පහයි |
| | | ලී කෑලි 2 × 4 (8යි) අටයි |
| | | ලී කෑලි 2 × 4 (13යි) දහතුනයි |
| | | ලී කෑලි 2 × 1 (233යි) දෙසියතිස්තුනයි |
| | | ලී කෑලි 2 × 1 (4යි) |
| | | ලී කෑලි 2 × 1 (45යි) |
| 18. 18796 | ... | සපු ලී (4යි) |
| 19. 15794 | ... | කොස් ලී (1යි) |
| 20. 19815 | ... | අල්මාරි දෙර ලී (1යි) |
| 21. 26317 | ... | ඇලඩින් ලාම්පුවක පහත කොටස (1යි) |
| 22. 15284 | ... | යකඩ දෙර යතුරු තහඩු (1යි) |
| 23. ඒ.ආර්. 1021/72 | ... | කැමරාවක් (1 යි) |
| 24. ඒ.ආර්. 2074/73 | ... | කුඩා මේස (1යි) |
| | | කුඩා බෙර (3යි) |
| | | පිඟන් (2යි) |
| | | වීදුරු (1යි) |
| | | පිරිසි (3යි) |
| | | බේසන් (1යි) |
| | | ට්‍රන්ක් පෙට්ටි (1යි) |
| | | පින්තූර රාමු (5යි) |
| | | කුවා (1යි) |
| | | මේස හැඳි (3යි) |
| | | රූල් (1යි) |
| | | ඉස්කුරුප්පු නියන් (1යි) |
| | | කුඩා නියන් (1යි) |
| | | මිටිය (1යි) |
| | | ෆිකර් (1යි) |
| | | උදැල්ල (1යි) |
| | | කුඩා මේස රෙදි (1යි) |
| | | පරණ කුඩ (1යි) |
| | | කුඩා ට්‍රන්ක් පෙට්ටි (1යි) |
| | | සොලිග්‍රෑම් ටින් (1යි) |
| | | පයිප්ප (1යි) |
| | | කරාබුවක කෑල්ලක් (1යි) |
| 25. 30278 | ... | ලුනුමිදැල්ල ලී කොටන් (2යි) |
| 26. ඒ.ආර්. 293/70 | ... | සයිකලයක් (1යි) |
| 27. 23250 | ... | පොරොවක් (1යි) |
| 28. 25199 | ... | උදලු (2යි) |

ප්‍රධාන ලිපිකරු.

1973 ඔක්තෝබර් මස 02 වැනි දින,
මහනුවර, පා. උ. පා. ලේකම් කායඞාලයේ දීය.

10–555—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

**මහේස්ත්‍රාත් උසාවිය—චාවකච්චේරිය**

**බඩුබාහිරාදිය විකිණීම**

පහත සඳහන් හිමිකරුවන් නොමැති රාජසන්තක කරන ලද භාණ්ඩ 1973 නොවැම්බර් මස 03 වැනි දින පෙ.ව. 9.00 ට මෙම උසාවියේදී යාපනය ප්‍රාදේශීය උසාවි පාලන ලේකම්, කේ. සිවරත්නම් මහතා ඉදිරිපිට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

එදින පෙ.ව. 8.00 සිට පෙ.ව. 9.00 දක්වා විකිණීම සඳහා තිබෙන භාණ්ඩ උසාවියේදී පරීක්ෂා කළ හැක.

බඩු මිලයට ගනු ලබන්නා වෙන්දේසිය අවසානයේදී එම බඩු වෙන්දේසි කළ ස්ථානයෙන් ඉවත් කරගත යුතුය.

| නඩු අංකය | | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 4732 | ... | 1 රළේ පාපැදියක් අංක සී.එන්. 1949 |
| 5301 | ... | 1 පාපැදියක් අංක වයි.ආර්. 2580 |
| ඒ 85/71 | ... | 1 පලුදු වූ රළේ පාපැදියක් අංක ඩී.ජේ. 3180 |
| ඒ 155/71 | ... | 1 පාපැදි රාමුවක් අංක ඒ.ඩබ්ලිව්. 38934 |
| 26819 | ... | 1 රළේ පාපැදියක් අංක ඊ.ඩබ්ලිව්. 19326 |
| ඒ 117/72 | ... | 3 පිත්තල කළ |
| | | 1 පිත්තල සෙම්බු |
| | | 1 පිත්තල බාස්කට් |
| | | 4 පිත්තල ට්‍රේ |
| | | 3 පිත්තල තාච්චි |
| | | 1 පිත්තල කෝප්ප |
| | | 4 පිත්තල හැඳි |
| | | 4 පිත්තල සඳුන් භාජන |
| | | 1 රිදී කෝප්ප |
| | | 9 ප්ලාස්ටික් පිඟන් |
| | | 1 පිත්තල ලාම්පු |
| | | 1 පාපැදි හැඩල් |
| | | 3 පාපැදි මඩගාඩ් |
| | | 1 පරණ වූ අමතර කොටස් සමග පාපැදි රාමුවක් |
| | | 1 මිකී අත්ඔරලෝසු |
| ඒ 280/72 | ... | 1 පිලිප්ස් පාපැදියක් අංක බී. 73302 |
| ඒ 292/72 | ... | 1 රළේ පාපැදි අංක බී.ජේ. 21676 |
| 24357/බී. 622 | ... | 1 ඇෆ්පර් කැමරා |
| | | 1 අත්ඔරලෝසු—පෝර්ටූන් |
| ඒ.ආර්. 39 | ... | 1 පලුදු ලැරෙක්ස් අත්ඔරලෝසු |
| ඒ 1709/69 | ... | 1 රත්රන් යයි පැවසෙන කරාබු ජෝඩුවක් අඩංගු රතුපාට කාඩ්බෝඩ් පෙට්ටියක් |
| ඒ 211/70 | ... | 1 රළේ පාපැදි රාමු අංක 70 ජී. 125 |
| | | 1 රළේ පාපැදි රාමු අංක එස්. 00505 |
| ඒ 1113/68 | ... | 1 පරණ රෙදි සහ දැකැති දෙකක් සහිත සූට්කේස් |
| ඒ 1672/69 | ... | 1 සූට්කේස් |
| 9088 | ... | 2 හරිගත් ලන්තෑරුම් |
| 27097 | ... | 1 එම |
| — | ... | 1 කැලි පහේ විදුලි පන්දම් |
| 25048 | ... | 1 කැලි දෙකේ විදුලි පන්දම් |
| | | 1 කැලි දෙකේ විදුලි පන්දම් |
| 28005 | ... | 1 පිහියක් |
| 28392 | ... | 1 කැලෑ කපන පිහියා |
| 27925 | ... | 1 පිහියා |
| 28116 | ... | 1 පිහියා |
| 26504 සහ 5 | ... | 1 කැලෑ කපන පිහියා |
| | | 1 පොරවා |
| 27097 | ... | 1 පිහියා |
| 7731 | ... | 1 පොරවා |
| 7548 | ... | 1 උදැල්ලක් |
| 24026 | ... | 1 උදැල්ලක් |
| ඒ 10602/69 | ... | 1 උදැල්ලක් |
| 23957 | ... | 1 විදුලි පන්දමක් |
| 25079 | ... | 1 කැලි තුනේ විදුලි පන්දම් |
| | | 1 මිට රහිත උදැල්ලක් |
| 25160 | ... | 1 සහල් රාත්තල් |
| 27221 | ... | 1 තාච්චි |
| 9650 | ... | 1 උදලු |
| | | 1 පොරවා |
| 8531 | ... | 1 ඇලුමිනියම් කේතල (පොඩි) |
| මිශ්‍ර | ... | එදිනෙද එකතු කරනලද වීදුරු සහ හිස් අරක්කු බෝතල් |
| ඒ 89/63 | ... | 1 වලලු ජෝඩු |

මහේස්ත්‍රාත්, චාවකච්චේරි.

10–601—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

### බන්ධනාගාර දෙපාර්තමේන්තුව

පාවිච්චි කළ වාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1973 ඔක්තෝබර් මස 30 වෙනි දින පෙ. ව. 10 ට රාගම, මහර බන්ධනාගාර භූමියේදී පහත සඳහන් අංක දරණ වාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

| වාහන අංකය | වර්ගය |
|---|---|
| 1. ඕ. වී. 1682 | ... ඔස්ටින් ලොරිය. |
| 2. 1 ශ්‍රී 5457 | ... වොක්ස්වැගන් වෑන් රථය. |

(1) 1973 ඔක්තෝබර් මස 20 වැනි දින සිට 1973 ඔක්තෝබර් මස 30 වැනි දින දක්වා මෙම වාහන ඉහත සඳහන් ස්ථානයේදී කාර්යාල වේලාවලදී පරීක්ෂාකර බැලීමට පුළුවන.

(2) වැඩිම ඉල්ලුම්කරු එකෙනෙහිම මුදල් ගෙවා පැය 24 ක් ඇතුළත වාහනය රැගෙන යා යුතුයි.

(3) ඉල්ලුම් කළ යම් ඉල්ලුම්කරුවෙකුගේ මිළ ගණන් නැතහොත් සියළුම ඉල්ලුම්කරුවන්ගේ මිළ ගණන් වුවත් ප්‍රශ්නයක් නො මැතිව ප්‍රතික්ෂේප කිරිමට බලය රජය සතුව ඇත.

ඒ. ඒ. ද සිල්වා,
වැඩ බලන බන්ධනාගාර කොමසාරිස්.

බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 9,
1973.10.3.

10–548—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### මොනරාගල මහේස්ත්‍රාත් උසාවියේ භාණ්ඩ වෙන්දේසිය

රාජසන්තක කරන ලද සහ අයිතිවාසිකම් ඉදිරිපත් නොකරන ලද පහත සඳහන් භාණ්ඩ 1973 නොවැම්බර් 3 වෙනි දින පෙරවරු 9 ට මොනරාගල මහේස්ත්‍රාත් උසාවි භූමියේදී, බදුල්ලේ ප්‍රාදේශීය උසාවි පාලන ලේකම් ඉදිරිපිටදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වමි.

2. එම භාණ්ඩ වෙන්දේසි කරනු ලබන දින පෙරවරු 8.30ට උසාවි භූමියේදී පරීක්ෂා කළ හැක. වෙන්දේසියේදී මිළදී ගනු ලබන භාණ්ඩ ඒ අවස්ථාවේදීම නියමිත මුදල් ගෙවා වහාම උසාවි භූමියෙන් ඉවත් කර ගත යුතුය.

3. නඩු අංක සහිතව මෙම බඩු පිළිබඳව විස්තර ලැයිස්තුවක් උසාවි දැන්වීම් පුවරුවේ පළ කර ඇත.

සී. අමරසිංහ,
මහේස්ත්‍රාත්, බදුල්ල.

1973 ඔක්තෝබර් මස 04 වෙනි දින,
බදුල්ලේ මහේස්ත්‍රාත් උසාවියේදීය.

| භාණ්ඩ | ගණන |
|---|---|
| මැණික් ගරන කූඩා | 119 |
| උදලු | 28 |
| ඉල්ලම් කූරු | 16 |
| කැති | 16 |
| බාල්දි | 15 |
| කූඩා බැරල් | 10 |
| ප්ලාස්ටික් කෑන් | 5 |
| විදුලි පන්දම් | 4 |
| පොරෝ | 5 |
| පිහි | 13 |
| කොන්ඩ පටිටම් | 1 |
| ඉබි | 2 |
| ගමන් මලු | 5 |
| ටයර් | 1 |
| ගිස්ගෝනි | 1 |
| හිස් ටොපි බෝතල් | 1 |
| ඇලුමිනියම් මුට්ටි | 1 |
| එනමල් දිසි | 1 |
| දොදොල් හැදි | 1 |
| කියත් | 1 |
| සාරි කටු | 1 |
| අත් ඔරලෝසු | 2 |
| මුදු | 1 |
| රිදී හවඩි | 1 |
| පැන්ඩන්ට් | 1 |
| රැලේ බයිසිකල් අංක ඒයූ 44504 | 1 |
| රැලේ බයිසිකල් අංක සීඕ 94759 | 1 |
| සහ තවත් බඩු | |

10–544—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

### වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පරණ ගැසට් පත්‍ර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1973. 11. 02 වැනි දින පූ. භා. 10. 30ට කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හතරවැනි මහලේදී පරණ ගැසට් පත්‍ර රාත්තල් 500ක් පමණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මේවා ඉතාම වැඩි මිලට ඉල්ලුම් කරන තැනැත්තාට ලබාගත හැකිය. ඉල්ලුම්කර ලබා ගත් තැනැත්තා ඒ වේලාවේදීම මුදල් ගෙවා එම ගැසට් පත්‍ර රැගෙන යා යුතුයි.

ගැසට් පත්‍ර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන දින උදේ 9.30 සිට 10.00 දක්වා එවා පරීක්ෂා කර බැලීම සඳහා අපේක්ෂකයන්ට ඉඩ සලසා ඇත.

ආර්. යූ. ප්‍රනාන්දු,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1973. 10. 05 දින.
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 7.

10–554—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

---

## තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

සුරා 54/73

### අරක්කු රේන්ද නැවත විකිනීම–කොළඹ දිස්ත්‍රික්කය, 1973

1973 නොවැම්බර් 01 දින සිට 1973 දෙසැම්බර් 31 දින දක්වා ඇති තනි අයිතිය පිට පහත පෙනෙන කොන්දේසිවලට යටත්ව මෙහි දැක්වෙන අරක්කු තැබෑරුමේ සිල්ලරට අරක්කු විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

(1) 1972.10.31 දින අංක 31/3 දරණ රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ දැක්වෙන අරක්කු රේන්ද විකිණීම පිළිබඳ කොන්දේසි.

(2) සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට වලංගුව පවතින පොදු කොන්දේසි.

2. පහත දැක්වෙන කාර්යාලයන්ගෙන් ලබාගත හැකි නියමිත පෝරම මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ පහත පෙනෙන "බී" තීරයේ එක් එක් තැබෑරුමට කෙළින් දක්වා තිබෙන නියමිත මුදල් තැන්පත් කළ බවට කච්චේරියෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රා. ආ. නි. ගෙන් ලබාගත් වත්කම් සහතිකයක්ද සමඟය. ප්‍රාදේශීය ආදායම් නිලධාරිගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතික, එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේම එම සහතික නිකුත් කිරීම සඳහා පනදම් කර ගත් කිසිදු දේපොලක් විකුණා නැති නම්, එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු පහත කාලයක් සඳහා වලංගුවේ.

රේන්ද කාලය අවසන් වීමට පෙර, වත්කම් සහතිකය වළංගු කාලය අවසන් වන අවස්ථාවන්හිදී, සම්පූර්ණ රේන්ද කාලය සඳහා වළංගු වන අළුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමඟ ඉදිරිපත් කළ යුතුය. එසේ නැත්නම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයක් වළංගු කාලය අවසන් වීමට යටත් පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතුයි.

(ඒ) ඕනෑම කච්චේරියකින්,

(බී) කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, සුරාබදු කායර්‍යාලයයෙන්,

(සී) කොළඹ සුරාබදු මණ්ඩල කායර්‍යාලය,

(ඩී) කළුතර සුරාබදු මණ්ඩල කායර්‍යාලය,

(ඊ) හලාවත සුරාබදු මණ්ඩල කායර්‍යාලය.

3. සීල් තබන ලද කවරයක බහාලූ එක් එක් ටෙන්ඩර පත් ඇතුළත් කවරයේ උඩ වම්පස කෙළවරේ ''අංක 27 දළුවාකොටුව අරක්කු තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය—කොළඹ දිස්ත්‍රික්කය 1973'' යනුවෙන් සඳහන් කර (අ) කොළඹ කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ (ආ) ලියාපදිංචි තැපෑලෙන්, කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමා වෙත එවීමෙන් හෝ මෙහි පහත සඳහන් උපලේඛනයේ ඒ ඒ තැබෑරුමට කෙළින් දක්වා ඇති වේලාවන් සහ දිනයන්හි දී හෝ ඊට පෙර හෝ ලැබෙන්නට සැලැස්විය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාවේ දී කච්චේරියට පැමිණිය යුතුයි.

4. තෝරාගත් ටැන්ඩර්කරු ඒ මොහොතේම ගැනුම්කරු වශයෙන් දනුම්දෙනු ලබන අතර, විකිණීම සඳහා කොන්දේසි අත්සන් කිරීමට අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි අනුව 9 (1) (ඒ) කොන්දේසි යටතේ නියමිත තැන්පත් ඇප මුදල ආණ්ඩුවේ ඒජන්ත තුමාට ගෙවිය යුතුයි.

5. මිළයට ගන්නා හැටියට වරප්‍රසාද ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂෙප කිරීමෙන් හෝ උවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේ දී ඉදිරිපත් කිරීමට අපොහොසත්වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදලට අහිමියෙක් වන අතර වරදකරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ද පුළුවන. මෙයට විශේෂයක් වශයෙන් සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලංසුකරු විසින් විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු, ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් කළ මුදල් ආපසු දීම සහ ඉහත කී සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලංසුකරු විසින් තබන ලද ඇපයද ආපසු ගෙවනු ලැබේ.

6. කිසි කරුණක් නොදක්වා ම එකක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්ත තුමාට තිබේ.

7. 1973 වර්ෂය සඳහා දනට තැබෑරුම පවත්වාගෙන යනු ලබන ස්ථානය ලබාගත හැකිවේදැයි කිව නොහැක. සෑම ස්ථානයකම කොළඹ දිසාපති තුමාගේ පූර්ව අනුමැතිය ලබාගත් ස්ථාන විය යුතුයි.

8. වැඩි විස්තර කොළඹ කච්චේරියෙන් ඉල්ලා යැවීමෙන් ලබා ගත හැක.

ඩී. ඩබලිව්. ද අල්විස්,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

කොළඹ කච්චේරිය,
1973 ඔක්තෝබර් 10, දින.

### කොළඹ දිස්ත්‍රික්කය

### ඉහත දක්වූ අනුමතකළ තැබෑරුම

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) විකිණීම කරන දිනය | (ඊ) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව | (එෆ්) තැබෑරුම් විවෘත කරන වේලාව | (ජී) තැබෑරුම් වසන වේලාව | (එච්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. |
|---|---|---|---|---|---|---|---|
| 27 ... | උතුරු අළුත්කුරු කෝරළේ ... | දළුවාකොටුව ගමේ පමණක් ... | 73.10.30 ... | පෙ.ව. 10 ... | පෙ.ව8.00 ... | ප.ව. 7.00 ... | 500 |

10–770—73.10.19 දින අංක 82 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළග ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු ඒවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ. යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| ඔක්තෝබර් ... | 73.10.05 සිකුරාද ... | 73. 9.25 අඟහරුවාද | දහවල් 12.00 |
| | 73.10.12 සිකුරාද ... | 73.10.03 බදාද | දහවල් 12.00 |
| | 73.10.19 සිකුරාද ... | 73.10.10 බදාද | දහවල් 12.00 |
| | 73.10.26 සිකුරාද ... | 73.10.17 බදාද | දහවල් 12.00 |
| නොවැම්බර් ... | 73.11.02 සිකුරාද ... | 73.10.24 බදාද | දහවල් 12.00 |
| | 73.11.09 සිකුරාද ... | 73.10.31 බදාද | දහවල් 12.00 |
| | 73.11.16 සිකුරාද ... | 73.11.07 බදාද | දහවල් 12.00 |
| | 73.11.23 සිකුරාද ... | 73.11.14 බදාද | දහවල් 12.00 |
| | 73.11.30 සිකුරාද ... | 73.11.21 බදාද | දහවල් 12.00 |
| දෙසැම්බර් ... | 73.12.07 සිකුරාද ... | 73.11.28 බදාද | දහවල් 12.00 |
| | 73.12.14 සිකුරාද ... | 73.12.05 බදාද | දහවල් 12.00 |
| | 73.12.21 සිකුරාද ... | 73.12.12 බදාද | දහවල් 12.00 |
| | 73.12.28 සිකුරාද ... | 73.12.19 බදාද | දහවල් 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.